# තීර්ථ

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ ලියාපදිංචි කරන ලදී.

යහපත් වූ වරායක නත්කල් දැක්ම

පස්වන කාණ්ඩය / 11 වන කලාපය / 2018 පෙබරවාරි

03 පිටුව
මෙවර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ලාභය
**බිලියන 11 ක් පමණ වෙනවා....**
වරාය හා නාවික අමාත්‍ය මහින්ද සමරසිංහ

12-13 පිටුව
**INAP-2017 අභිමානය**

11 පිටුව
**නව මොක්පෝ වරාය**

23 පිටුව
**මුහුදු පතුලේ කෞතුකාගාරය**



# වරායේ හෙට දවස ගොඩ නගන

# නව මානව සම්පත් ප්‍රතිපත්තියක්

## වැටුප් විෂමතා අක්‍රමිකතා මුලිනුපුටා දැමීමට පියවර...

Con. 04


**2018** වර්ෂය සියලුම සේවක මහත්ම මහත්මීන්ට හා ඔවුන්ගේ දුවා දරුවන්ට සාමය, සෞභාග්‍ය, සශ්‍රීකත්වය සපිරි සියලු පැතුම් ඉටුවන නව වසරක් වේවායි තීර්ථ සුභාශිංසනය එක් කරන්නේ හදපිරි සතුටිනි.

ගරු සභාපතිතුමාගේ දූරදර්ශී එඩිතර තීරණ මැදින් සියලුම සේවක මහත්ම මහත්මීන් සඳහා නව මානව සම්පත්, සැළසුමකට දොරටු විවර කරමින්, සේවක මණ්ඩල ගැටළු වැටුප් විෂමතා සහ අක්‍රමිකතා සඳහා තිත තැබෙන මෙම නව මානව සම්පත් සැළැස්ම වරායේ හෙට දවස වඩාත් පැහැබර කරනු නොඅනුමානය.

සමුද්‍රික කලාපයේ කේන්ද්‍රීය වරායක් ලෙස කටයුතු කරමින් ආසියානු කලාපයේ වරාය ක්ෂේත්‍රයේ පෙර ගමන්කරුවා වීමට යන ගමනේ දී වරායක් ලෙසින් අන්තර් ජාතික අනුබද්ධිත සමුළුවේ මේ වසර සඳහා ගරු සභාපතිතුමන්ලා ලැබු නායකත්වය සේවක අප සැමට අභිමානයක්ම ගෙන දෙන්නේ ය.

උදාවූ වසර සියලු සේවක මහත්ම මහත්මීන් ඒකාවන්ව කණ්ඩායම් හැඟීමෙන් වරාය ඵලදායිතාවය නංවාලීමට දායක වී ජාතියේ හදවතේ ජ්‍යෙෂ්ඨයෙකු වන්නට අදිටන් කර ගැනුමට කාලය එළැඹ ඇත.

හෙට දවස පිළිබඳ අභූත චෝදනා නගමින් ''පාරම් බෑම'' නොව වරායේ අහිත සේවක මහත්මයෙකු සේවක මහත්මියක ලෙසින් වරායේ මෙහෙයුම් හුයට දායක වීමේ පරම අදිටන ඇති කරගැනීම යුක්ති යුක්ත වන්නේය. හෙට දවසේ ඉදිවීමට පෙරමග බලා සිටින උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය, නැගෙනහිර පර්යන්තයේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය සක්‍රියව සිදුවෙමින් එය හුදෙක් වදන් වලට පමණක් සීමා නොවී වචනය අතික්‍රමණය කළා වූ ක්‍රියාකාරි පිළිවෙතකට පෙළ ගැසෙමින්, කොළොම්තොට මතු නොව සමස්ථ වරාය අධිකාරියම දැයේ ප්‍රබල ආයතනය ලෙස අභිසෙස් කරන්නට උදා වූ මේ නව වසරේ තිර අදිටනකට එළඹෙමු.



## සාමූහිකත්ව ප්‍රවේශය

**කළමණාකරණ කර්තෘ**
නලින් අපොන්සු

**නිරීක්ෂණය**
චිත්‍රාල් ජයවර්ණ
හර්ෂ උදයකාන්ත පීරිස්
කාව්‍ය ඉන්ද්‍රජිත්

**සංස්කරණය**
උපුල් ගුරුගේ

**පිටු සැකසුම**
උදිත චන්දන

**සහාය පිටු සැකසුම**
දිමුතු තෙන්නකෝන්

**පරිගණක අකුරු ඇමුණුම**
රේණුකා දමයන්ති

**තාක්ෂණික සහාය**
රුක්ෂාන් සමරධීර
අසංක රාජපක්ෂ

**ඡායාරූප**
ඩී.කේ. වැලිකල
මහින්ද තෙන්නකෝන්

**සම්බන්ධීකරණය**
දිල්රුක් ජයසේකර
සංජීව විජේසේකර
දේවිකා හෙට්ටිආරච්චි
සන්ධ්‍යා විතාන
එම්.එෆ්.එෆ්. ෆර්සානා

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**
**සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ ප්‍රකාශනයකි**

# බහලු මෙහෙයුම් මිලියන 6 සීමාව පසු කරමින්

## කොළඹ වරාය බහලු මෙහෙයුමේ විශිෂ්ටත්වය ට




කොළඹ වරාය බහලු මෙහෙයුම් ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයකට එළැඹෙමින් බහලු මෙහෙයුම් මිලියන 6 සීමාව ඉක්මවීමට පසුගියදා සමත් වි ය. එම විජයග්‍රාහී අවස්ථාව සමරමින් ජය බහලු පර්යන්තයේ පැවැති විශේෂ උත්සවයට එක්වූ වරාය හා නාවික අමාත්‍ය මහින්ද සමරසිංහ මහතා සභාව අමතමින්,

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, CICT, SAGT පර්යන්ත සමග එකට එකමුතුව තරගකාරී හැඟීමෙන් බැහැරව කොළඹ වරාය ලෝක බහලු මෙහෙයුම් වරායයන් අතර, ඉතා ඉහළින් ඔසවා තැබීමට කටයුතු කරන බවත්, ඒ අනුව අද දවසේ මෙම ජයග්‍රහණය උදෙසා උර දුන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ අනෙකුත් පර්යන්ත වල පූර්ණ දායකත්වය හා නෞකා මෙහෙයුම් ක්‍රියාවලියට සම්බන්ධ සියළු පාර්ශවයන් වෙත තමාගේ ගෞරව ප්‍රණාමය පුද කරන බවත් පැවැසී ය.

මෙහිදී අදහස් දැක්වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා උත්සව සභාව අමතමින් වරාය ශිෂ්ඨාචාරයේ තවත් ඓතිහාසික සංධිස්ථානයක් වෙත පියනැගීමට හැකිවීම පිළිබඳව දැඩි සතුටට පත්වන බවත්, මේ අවස්ථාවට සහාය දැක්වූ සැමට ප්‍රණාමය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත් පැවසී ය. තව ද නැගෙනහිර පර්යන්තයේ මෙහෙයුම් කටයුතු කඩිනමින් ආරම්භ කිරීමත් සමග විශිෂ්ඨ ඵලදායිතාවකින් යුතුව කටයුතු කරමින් කොළඹ වරාය වෙත විශාල නෞකා ආකර්ශනය කර ගැනීමට කටයුතු කරන බවත් පැවසී ය.

කොළඹ වරාය සිය බහලු මෙහෙයුම් ක්‍රියාවලිය තුළ බහලු මිලියන 1 සීමාව ඉක්මවීමට 1995 වර්ෂයේ දී සමත්වේ. අනතුරුව වසර 9 කට පසුව 2004 වර්ෂයේ දී SAGT පර්යන්තය ද හා එක්ව බහලු මිලියන 2 සීමාව ඉක්මවන කොළඹ වරාය 2006 වර්ෂයේ දී බහලු මිලියන 3 සීමාව පසුකරයි. අනතුරුව 2010 වර්ෂයේ දී බහලු මිලියන 4 සීමාව ද, CICT පර්යන්තය සමග එක්ව 2015 වර්ෂයේ දී බහලු මිලියන 5 සීමාව ද ඉක්මවීමට කොළඹ වරාය සමත් වේ.

ශ්‍රී ලාංකේය වරාය ක්ෂේත්‍රය තුළ බහලු මෙහෙයවීම මිලියන 6 සීමාව ඉක්මවීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජයබහලු පර්යන්තය මෙන්ම සහෝදර පර්යන්තයන් වන SAGT, CICT පර්යන්තයන්ගේ දායකත්වය මෙන්ම එහි උපාය මාර්ගික අලෙවිකරණ ක්‍රමවේදය ද වෙසෙසින් කැපී පෙනේ.

ජාත්‍යන්තර තත්ත්වයේ සේවා සපයමින් සේවාලාභීන් උපරිම තෘප්තිමත් භාවයට පත්කරමින් අවම කාලයකින් නෞකා සේවාවන් සපයමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ස්වකීය භූමියේ වටිනාකම් මැනවින් උපයුක්ත කරගනිමින් සහෝදර පර්යන්තයන්ගේ සුසංයෝගී දායකත්වය තුළින් ප්‍රධාන නැව් සේවා හා පෝෂිත නැව් සේවා කොළඹ වරාය වෙත ආකර්ෂණය කර ගැනීමට නිරන්තරයෙන් කටයුතු කරමින් සිටියි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මේ සා සුවිසල් ජයග්‍රහණයෙහිලා වත්මන් රජයේ වරාය හා නාවික ගරු අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමාගේ විශිෂ්ඨ නායකත්වයත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතාගේ නිසි කළමණාකාරීත්වයත් වරාය මෙහෙයුම් ක්‍රියාවලියට සම්බන්ධ සියලුම පාර්ශවයන්ගේ යහපත් නායකත්වය තුළින් පසුගිය වසරවලට සාපේක්ෂව කඩිනම් සංවර්ධනයක් කරා ළඟාවීමට හැකි ව තිබේ.

**සටහන -උපුල් ගුරුගේ**

# මෙවර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ලාභය බිලියන 11 ක් පමණ වෙනවා....

## වරාය හා නාවික අමාත්‍ය මහින්ද සමරසිංහ

**සාකච්ඡා සටහන - වසන්ත අලකේශ්වර**

**ජගත් දේශපාලනයේ සම්භාවනාව ට පාත්‍ර වූ ඔහු අද දවසේ වරාය හා නාවික කටයුතු අමාත්‍ය ධූරය හොබවන්නේ ය. මේ වරාය හා සමුද්‍රීය ක්ෂේත්‍රයේ හෙට දවස පිළිබඳ එතුමා සමග කළ සංලාපයකි....**



**ඔබතුමාට පැවරී ඇත්තේ භාරදූර වගකීමක්. වරාය හා නාවික අමාත්‍යවරයා වශයෙන් ඔබ ගන්නා ඉදිරි පියවරයන් කවරේද..?**

විශේෂයෙන් ම පසුගිය මැයි මාසයේ සිට තමයි මා මෙම අමාත්‍යාංශයේ වැඩකටයුතු ආරම්භ කළේ. මේ කාලය තුළ බොහෝ ප්‍රමාද වී තිබූ යෝජනා ගණනාවකට ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කර තිබෙනවා. බොහෝ ඒවාට කැබිනට් අනුමැතිය ලබාගෙන එම යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික පියවරයන් දැනටමත් ගෙන තිබෙනවා.

ඒ අතරින් මට තිබූ ප්‍රධාන අභියෝගය තමයි හම්බන්තොට වරායේ ගිවිසුම පිළිබඳ කාරණාව. මම අමාත්‍යාංශය භාරගන්නට පෙර ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් චීන රජය ත් සමග එකඟතාවයකට පැමිණ ටෙන්ඩර් පටිපාටියක් හරහා එක් පාර්ශවයක් තෝරාගෙන රාමුගත සැලැස්මක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා අනුමැතිය ලබාගෙන තිබුණා. ඒ රාමුගත සැලැස්ම පදනම් කරගෙන තමයි ඉදිරි කටයුතු කරන්නට මට අවස්ථාව තිබුණේ. ඒ රාමුගත සැලැස්මෙන් පිට යන්නේ නැතිව අපි ඒ පාර්ශව සමග සාකච්ඡා ආරම්භ කළා.

**හම්බන්තොට වරාය රට ට විශාල ණය බරක් ගෙනදුන්න ව්‍යාපෘතියක් හැටියට තමයි සාකච්ඡා වෙන්නේ..?**

මේ වරාය ඉදිකරන්නට පසුගිය රජයෙන් අති විශාල ණය මුදලක් චීනයෙන් ලබාගෙන තිබෙනවා. එම ප්‍රමාණය ඇමරිකන් ඩොලර් මිලියන 1.5 ක එහෙමත් නැත්නම් ඇමරිකන් ඩොලර් මිලියන 1500 ක වාණිජ ණයක් අරගෙන තිබුණා. මේ නිසා ශ්‍රී ලංකා වරාය අධිකාරිය ට විශාල ණය බරක් දරන්න සිදුවුණා. වාර්ෂිකව වරාය අධිකාරිය ලබන ලාභයෙන් බිලියන 10 ක් පසු-ගිය වර්ෂයේ මෙම ණය පියවීම සඳහා ගෙවීමට සිදු වුණා. මේ වර්ෂයේ ණය ප්‍රමාණය බිලියන 12 ක් වුණා. අදාළ ගිවිසුම ක්‍රියාත්මක වීම ත් සමග වරාය අධිකාරිය ට තිබුණු ණය ගෙවීමේ වගකීමෙන් නිදහස් වෙන්න හැකියාව ලැබුණා. මේ නිසා මේ වර්ෂයේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලබන ලාභය බිලියන 11 ක් පමණ වෙනවා.

**හම්බන්තොට වරාය චීනයට දුන්නා කියලා චෝදනාවක් එල්ල වෙනවා. ඒ සම්බන්ධයෙන් අදහස් දක්වූවොත්..?**

එය සම්පූර්ණයෙන් ම අසත්‍ය කතාවක්. මෙතනදි කිසිඳු විකිණීමක් සිදුවෙලා නැහැ. සිදුව ඇත්තේ බදු දීමක් පමණයි. කොළඹ වරායේ CICT සහ SAGT පර්යන්ත බදු දීමේ ක්‍රමවේදය ම මේ සඳහා අදාළ කරගෙන තිබෙනවා. ඒ අනුව ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගම් දෙකක් සඳහා එහි ක්‍රියාකාරීත්වය පැවරෙනවා. ඒ HIPG හෙවත් හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහය (Hambanthota International Port Group) හා HIPS හෙවත් හම්බන්තොට ජාත්‍යන්තර වරාය සේවා පුද්ගලික සමාගම (Hambanthota International Port Service Co.(Pvt) Ltd) යි. මෙම සමාගම් දෙක හරහා තමයි හම්බන්තොට වරායේ ඉදිරි සංවර්ධන හා මෙහෙයුම් කටයුතු සිදුකෙරන්නේ.

**මෙම ව්‍යාපෘතිය හරහා රට ට ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධයෙන් පැහැදිලි කළොත්..?**

නාවික ක්ෂේත්‍රයේ වේගවත් සංවර්ධනයක් සඳහා ශ්‍රී ලංකාවේ වරායන් කටයුතු කිරීමේ දී හම්බන්තොට වරාය ට ඇත්තේ සුවිශේෂී ස්ථානයක්. භාණ්ඩ නැව්ගත කිරීමේ කේන්ද්‍රීය වරායක් ලෙස ත් අන්තර්ජාතික වෙළඳාමේ ජාත්‍යන්තර සේවා සැපයුම් කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් ලෙසත් සැලකෙන හම්බන්තොට වරාය, චීන රජයේ චයිනා මර්චන්ට් පෝර්ට් හෝල්ඩින්ග්ස් සමාගම ශ්‍රී ලංකාවේ දී සිය ආයෝජනයන් රාජ්‍ය හා පෞද්ගලික සහයෝගීතා ගිවිසුමක් (PPP) ලෙස ක්‍රියාත්මක වන අවස්ථාවක් ලෙස සැලකිය හැකියි. මෙහි දී ඇමරිකන් ඩොලර් බිලියන 1.12 ක මුදලක් ශ්‍රී ලංකා රජයට ගෙවීමට ක්‍රියාකරන අතර වසර පහක් තුළ තවත් ඇමරිකන් ඩොලර් මිලියන 600 ක් ආයෝජනයක් කිරීමට ගිවිසුම් ගතව සිටිනවා. මෙය රටක් හැටියට ශ්‍රී ලංකාව ලබාගත් විශාල ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ හැකියි.

**කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සම්බන්ධයෙන් ඔබතුමා සේවකයින් සඳහා අලුත් පොරොන්දුවක් ලබා දී තිබෙනවා..?**

ඇත්ත වශයෙන් ම කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය වරාය අධිකාරිය ට විශේෂිත වූ පර්යන්තයක්. වරාය අධිකාරියේ අනාගත පැවැත්ම සඳහා නැගෙනහිර පර්යන්තයේ සංවර්ධන කටයුතු සෘජුව ම බලපානවා. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 38 වන සංවත්සර උළෙල ට පැමිණි අතිගරු ජනාධිපතිතුමා ප්‍රසිද්ධියේ ම සඳහන් කරනු ලැබුවා ''නැගෙනහිර පර්යන්තය ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුව තිබිය යුතුයි'' කියලා. ඒකට හේතු කිහිපයක් තිබෙනවා. අද කොළඹ වරාය ගත්තම JCT තිබෙනවා. ඊට අමතරව CICT සහ SAGT පර්යන්ත දෙක ත් තිබෙනවා.

සමස්තයක් ලෙස ගත්කල විශාල නැව් ගෙන්වා ගත හැකිව තිබෙන්නේ පෞද්ගලික අංශය සතුව තිබෙන CICT පර්යන්තය ට පමණයි. SAGT සහ JCT පර්යන්තයන් ට විශාල නෞකා ගෙන්වා ගැනීමේ හැකියාවක් නැහැ. අද ජාත්‍යන්තර සමාගම් එකතුවෙලා විශාල නැව් මිළදීගෙන එහෙම නැත්නම් නිෂ්පාදනය කරලා ප්‍රවාහන කටයුතුවලින් සියයට 80 ක් 90 ක් පමණ කරන්නේ ලොකු නැව් හරහා. මේ තත්ත්වයට මුහුණදීමට ඇති හොඳම විසඳුම ගැඹුරින් වැඩි නැගෙනහිර පර්යන්තය සංවර්ධනය කිරීම යි. ඒ සඳහා අවශ්‍ය ඉදිරි පියවරයන් මේ වනවිට ත් ගෙන තිබෙනවා. මීට අමතරව දැනට රජය සතුව පවතින ජය බහලුම් පර්යන්තයේ 5 වන අදියර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගෙන ඒ සඳහා ටෙන්ඩර් පත් කැඳවීමට ත් ක්‍රියාකර තිබෙනවා. ජය බහලුම් පර්යන්තයේ මෙම සංවර්ධන කටයුතු සිදුකිරීම ත් සමග නැව් දෙකක් එක විට මෙහෙයුම් සිදුකිරීමට හැකියාව ලැබෙනවා. මෙම සංවර්ධන ව්‍යාපෘතිය නවීන තාක්ෂණ ක්‍රමවේදනයන් ට හා පරිසර හිතකාමී හරිත ක්‍රමයක් යටතේ ක්‍රියාත්මක කිරීමට ත් සැලසුම් කර තිබෙනවා.

06 පිටුව ට...

> "වරාය අධිකාරියේ අනාගත පැවැත්ම සඳහා නැගෙනහිර පර්යන්තයේ සංවර්ධන කටයුතු සෘජුව බලපානවා. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 38 වන සංවත්සර උළෙල ට පැමිණි අතිගරු ජනාධිපතිතුමා ප්‍රසිද්ධියේ ම සඳහන් කරනු ලැබුවා "නැගෙනහිර පර්යන්තය ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුව තිබිය යුතුයි" කියලා."



# කොළඹ වරාය ලෝකයේ ඉහළම තැනකට ඔසවා තබනවා

**මහින්ද සමරසිංහ**

වරාය හා නාවික කටයුතු අමාත්‍ය

අද දවසේ කොළඹ වරාය ලෝකයේ හොඳම වරායන් අතරින් 23 වැනි වරාය ලෙසට ස්ථානගත වී ඇති බවත්, එම ස්ථානය පිළිබඳ පුද්ගලිකව තමා කිසිසේත් සතුටුදායක නොවන බවත්, තම පාලන කාලය තුළ කොළඹ වරාය ලෝකයේ ඉහළම තැනකට ඔසවා තැබීමට තමා අපේක්ෂා කරන බවත්, අන්තර් ජාතික අනුබද්ධිත වරාය ජාලයේ සමුළුව අමතමින් වරාය හා නාවික කටයුතු අමාත්‍ය මහින්ද සමරසිංහ මහතා පැවසීය.

තවද, අපගේ වරායයන් සතු පිහිටීමේ ශක්‍යතාවය පදනම් කරගෙන විවිධ සංවර්ධන සැළසුම් රැසක් ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමටත්, යටිතල පහසුකම් පුළුල් කිරීම හා කාර්යක්ෂමතාව වැඩිකිරීම තුළ වරාය ඵලදායිතාවය ඉහළ මට්ටමක් කරා ගෙන ඒමට ඒ තුළින් අපේක්ෂිත ය.

නව වරායයන් ඉදිකිරීම හා සංවර්ධනය කිරීමට යන ගමනේ දී පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීමේ හැකියාව පිළිබඳව ද මෙහිදී විශේෂ අවධානය යොමු කෙරේ.

විශේෂයෙන් විදේශීය පාර්ශවයන් සමග පමණක් නොව ශ්‍රී ලාංකේ ය පෞද්ගලික අංශයේ ක්‍රියාශීලි දායකත්වය ද මේ සඳහා අපේක්ෂිතය. පෞද්ගලික අංශයේ දායකත්වය මෙම සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන ඇන්ජිම ලෙස රජය විසින් මේ වන විට හඳුනාගෙන ඇත. අපිට ඔවුන් සතු හැකියාව සහ කැපවීම පිළිබඳ සතුටුදායක මට්ටමකට ළඟාවීමට හැකිවී තිබේ. එය කොළඹ වරාය 23 වැනි ස්ථානයේ සිට ඉන් ඔබ්බට ගෙන ඒමේ දී සුවිසල් දායකත්වයක් සපයන බවට තමා තුළ දැඩි විශ්වාසයක් ඇති බවත් වැඩිදුරටත් කරුණු දක්වමින් අමාත්‍යවරාය පැවසී ය.



# හෙට දවස උදෙසා වරාය ව්‍යාපෘති රැසක් සැළසුම් කොට තිබෙනවා

**ආචාර්ය පරාක්‍රම දිසානායක**

සභාපති - ශ්‍රී ලංකා වරාය අධිකාරිය

හෙට දවස උදෙසා වරාය ව්‍යාපෘති රැසක් සැළසුම් කොට ඇති බවත්, මේ වන විට උතුරු කොළඹ වරාය ව්‍යාපෘතිය සැලසුම් කිරීම සිදුවන බවත් පැවසීය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගරු සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා මේ බැව් සඳහන් කළේ 19 වන අන්තර්ජාතික අනුබද්ධිත වරාය ජාලයේ සමුළුව අමතමිනි. වැඩිදුටත් අදහස් දක්වූ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා,

INAP ජාලයේ පුරෝගාමී දායකත්වයක් සැපයූ එවකට වරාය අමාත්‍ය එම්.එච්.එම්. අෂ්රොෆ් මැතිතුමා සමග රාජකාරි කිරීමට තමා වාසනාවන්ත වූ බවත්, ඒ පිළිබඳ තමා සතුට පලකරන බවත් පැවසීය. තවද, තමාගේ ධූර කාලය තුළ ස්වකීය නායකත්වය යටතේ INAP ජාලයේ සාමාජික වරායයන් වැඩිකර ගැනීමට වැඩපිළිවලක් සකස් කිරීමට කටයුතු යොදන බවත් පැවසීය.

එමෙන්ම, ගතවූ කාලය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය තබා ඇති ජයග්‍රාහී පියවර දෙස බැලීමේ දී ඒ සඳහා දායකත්වය දක්වූ සභාපතිවරුන්, අධ්‍යක්ෂ මණ්ඩල, උසස් නිලධාරීන්, සියලු සේවක මහත්ම මහත්මීන් දක්වූ දායකත්වය බෙහෙවින් අගය කරන බවත්, අද දවසේ වරාය දක්ම අනුව කටයුතු කරමින් ඉලක්ක සපුරා ගැනීමට හැකි වී ඇති බවත් පැවසීය.

## වරායේ හෙට දවස ගොඩ නගන...

01 පිටුවෙන්

ශ්‍රී ලංකාව සමුද්‍රික කලාපයේ කේන්ද්‍රය බවට පත් කිරීම රජය ගෙන යන වැඩපිළිවෙල සක්‍රීය කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට නව මානව සම්පත් ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට වරාය කළමණාකාරීත්වය පියවර ගනිමින් සිටියි. ජාත්‍යන්තරය හා බැඳුණු විශිෂ්ඨ සේවා සැපයුම් ආයතනයක සේවක මහත්ම මහත්මීන් ලෙස දැනුම කුසලතා හා ආකල්ප ප්‍රවර්ධනය කරමින් නව මානව සම්පත් ප්‍රතිපත්තියක් යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි මානව සම්පතේ අක්‍රමිකතා හා වැටුප් විෂමතා මුලිනුපුටා දමමින්, විනිවිද භාවයකින් යුතුව කටයුතු කරමින් බඳවා ගැනීමේ පටිපාටියේ සිට විශ්‍රාම ගැනීම දක්වා මානව සම්පත හා බැඳුණු ක්‍රියාදාමය තිරසාර පදනමකින් පවත්වාගෙන යාම මෙහි මූඛ්‍ය අරමුණ වේ. ඒ අනුව, වරාය අධිකාරියේ මානව සම්පත ලෙසින් සියලු සේවක මහත්ම මහත්මීන් හට එකසේ සලකන ප්‍රතිපත්තියක් මත පදනම්ව මානව සම්පත දියුණු කිරීමට මෙමගින් අපේක්ෂිතය. මේ සඳහා සියලු සේවක මහත්ම මහත්මීන්ගේ, වෘත්තීය සංගම් නියෝජිතයින්ගේ නිසි දායකත්වය ලබා ගැනීමට යෝජිත ය.




වසර ගණනාවක් තිස්සේ වැටුප් විෂමතා, සහ උසස්වීම් නොලැබ ඒකාකාරී රාජකාරි දිවියක් ගෙවමින් ආසාධාරණයට ලක් වූ විවිධ වෘත්තීය ශ්‍රේණි හඳුනා ගනිමින්, නව ක්‍රමවේදයක් ඔස්සේ මහපොළ සමුද්‍රීය විද්‍යායතනය හා සම්බන්ධිතව උසස් මට්ටමේ පුහුණු පාඨමාලා සහ විභාග ක්‍රමවේදයන් ඔස්සේ උසස්වීම් ඇතුළු සියලු වරප්‍රසාද සේවක මහත්ම මහත්මීන් හට ලබා දීමට යෝජිතය.

වත්මන් රජයේ වරාය හා නාවික ගරු අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමාගේ විශිෂ්ඨ නායකත්වයත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතාගේ කළමණාකාරීත්වයත්, වරාය මෙහෙයුම් ක්‍රියාවලියට සම්බන්ධ සියලුම පාර්ශවයන්ගේ යහපත් නායකත්වය තුළින් අධ්‍යක්ෂ (මානව සම්පත්) පී.රණතුංග මහතා ඇතුළු මානව සම්පත් කොට්ඨාශයේ දායකත්වය වරායේ හෙට දවස ගොඩ නගන නව මානව සම්පත් ප්‍රතිපත්තියක් සැකසෙනු ඇත.

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොට්ඨාශ ප්‍රධානීන්, උසස් නිලධාරීන් හා වෘත්තීය සමිති නියෝජිතයින්ගේ අදහස් හා යෝජනා පිළිබඳ විශේෂ සාකච්ඡා හමුවක් පසුගිය දා මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයේ ලලිත් ඇතුලත්මුදලි ශ්‍රවණාගාරයේ දී පැවැත් විණි.

# කොළඹ වරායේ ප්‍රතිනැව්ගත බහලු මෙහෙයුම්වල 20.4%ක වර්ධනයක්

කොළඹ වරායේ ප්‍රතිඅපනයන බහලු මෙහෙයුම් හෙවත් ප්‍රතිනැව්ගත මෙහෙයුම් ධාරිතාවයේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරයි. 2017 ජනවාරි මාසයට සාපේක්ෂව එය 20.4% ක වර්ධනයකි. 2017 වර්ෂයේ ජනවාරි මස ප්‍රතිනැව්ගත බහලු මෙහෙයුම් 362,451 ක් මෙහෙයුම් කොට ඇති අතර, 2018 වර්ෂයේ ජනවාරි මස ප්‍රතිනැව්ගත බහලු මෙහෙයුම් 436,303 ක් සිදුකර ඇත. මේ සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජයබහලු පර්යන්තය සමග, SAGT පර්යන්තය සහ CICT පර්යන්ත සුසංයෝගය ද එක්ව තිබේ. ජයබහලු පර්යන්තය (JCT) 2017 ජනවාරි මස ප්‍රතිනැව්ගත බහලු මෙහෙයුම් 114,282 ක් සිදු කළ අතර, එය 2018 ජනවාරි මස 164,252 කි. එනම්, ප්‍රතිශතයක් ලෙස 43.7% ක වර්ධනයකි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය තුළ බහලු මෙහෙයුම් ධාරිතාව ද 2017 ජනවාරි මාසයට සාපේක්ෂව 2018 ජනවාරි මාසයේ වර්ධනයක් පෙන්නුම් කරන අතර, 2017 වර්ෂයේ එය අඩි විස්ස සම ඒකක බහලු 156,010 ක් වූ අතර, 2018 වර්ෂයේ එය අඩි විස්ස සම ඒකක බහලු 194,688 ක් හෙවත් 24.8% ක ප්‍රතිශතාත්මක වර්ධනයක් ලෙසින් සමස්ථ රාජ්‍ය පර්යන්තයන්ගේ විශිෂ්ට වර්ධනයක් පෙන්නුම් කරයි.

සමස්ථ කොළඹ වරාය (Port Of Colombo) 2017 වර්ෂයේ ජනවාරි මස අඩි විස්ස සම ඒකක බහලු 484,866 ක් මෙහෙයුම් කර ඇති අතර, එය 2018 ජනවාරි මස අඩි විස්ස සම ඒකක බහලු 564,155 ක් මෙහෙයුම් කර තිබේ. එය ප්‍රතිශතයක් ලෙස 16.4% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

> “මේ වන විට ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් තුන් අවුරුදු සංවර්ධන සැළැස්මක් සකස් කර ඇති අතර, ඒ මගින් ඉදිරි කාලය තුළදී සංවර්ධන කටයුතු වඩාත් වේගවත්ව ඉදිරියට ගෙන යාමටත්, ඒ තුළින් බහලු මෙහෙයුම් තවදුරටත් ඉහළ නංවමින් කොළඹ වරාය ආසියාවේ කේන්ද්‍රීය වරායක් බවට පත්වීම අපේක්ෂිතය”

2017 වර්ෂයේ ජනවාරි මාසයට සාපේක්ෂව 2018 ජනවාරි මාසයේ කොළඹ වරායට නෞකා පැමිණීමෙහි ද වර්ධනයක් පෙන්නුම් කරයි. බහලු නෞකා, සාම්ප්‍රදායික නැව්බඩු නෞකා සහ අනෙකුත් නෞකාවන් සහ නෞකා අලුත්වැඩියාව හා නැංගුරම් කිරීම්වල 2017 ජනවාරි මාසයට සාපේක්ෂව 2018 වසරේ ජනවාරි 8.1% ක වර්ධනයක් පෙන්නුම් කරන අතර සංඛ්‍යාත්මකව 359 සිට 388 දක්වා වර්ධනයකි. 2017 වර්ෂයේ ජනවාරි මස කොළඹ වරායට පැමිණි බහලු නෞකා සංඛ්‍යාව 304 ක් වූ අතර එය 2018 වසරේ ජනවාරි මස 332 කි. එය ප්‍රතිශතයක් ලෙස 9.2% ක වර්ධනයකි.

කොළඹ වරාය බහලු මෙහෙයුම් ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයකට එළැඹෙමින් බහලු මෙහෙයුම් මිලියන 6.2 සීමාව ඉක්මවීමට පසුගිය දෙසැම්බර් මස සමත් වූ අතර එය 2016 වසර හා සංසන්දනය කරන විට 8.3% ක වර්ධනයන් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජයබහලු පර්යන්තයේ බහලු මෙහෙයුම් ධාරිතාවයේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරන අතර, 2017 වර්ෂයේ ඔක්තොම්බර් මාසයේ සිට වර්ධනය වෙමින් පවතින මෙම බහලු මෙහෙයුම් වර්ධනය පසුගිය ඔක්තොම්බර් මස සියයට 5.3 % කින් ද, නොවැම්බර් මස 8.2 % කින්ද, දෙසැම්බර් මස වන විට 13.9% ලෙස කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරයි. මේ වන විට ජයබහලු පර්යන්තයේ ඵලදායිතාව පෝෂක නැව් සඳහා (Feeder line) 3.2% කින් පෝෂිත නැව් (Main line) සඳහා 9.4% කින් ද කැපී පෙනෙන ලෙස වර්ධනය වී තිබේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ කොළඹ වරායේ මේ සා සුවිසල් ජයග්‍රහණයෙහිලා වත්මන් රජයේ වරාය හා නාවික ගරු අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමාගේ විශිෂ්ට නායකත්වයත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතාගේ නිසි මඟපෙන්වීම හා කළමනාකාරීත්වයත්, වරාය මෙහෙයුම් ක්‍රියාවලියට සම්බන්ධ සියලුම පාර්ශවයන්ගේ යහපත් දායකත්වය හා වෘත්තීය සමිති මෙන්ම සමස්ථ වරාය සේවක මහත්ම මහත්මීන් අතර පැවති සහ සම්බන්ධතාවය ඉතා ප්‍රශස්ත ලෙස වර්ධනය වී තිබීම ද තුළින් මෙවන් සංවර්ධනයක් කරා ලඟා වීමට හේතු වී තිබේ.

එමෙන්ම, මේ වන විට ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් තුන් අවුරුදු සංවර්ධන සැළැස්මක් සකස් කර ඇති අතර, ඒ මගින් ඉදිරි කාලය තුළදී සංවර්ධන කටයුතු වඩාත් වේගවත්ව ඉදිරියට ගෙන යාමටත්, ඒ තුළින් බහලු මෙහෙයුම් තවදුරටත් ඉහළ නංවමින් කොළඹ වරාය ආසියාවේ කේන්ද්‍රීය වරායක් බවට පත්වනු ඇත.

**සටහන -උපුල් ගුරුගේ**



# හෙට ලොව බබළවන දූ දරුවන් අගයමු



"ඔබේ මුදල් ඔබේ දරුවාට" තේමා කරගනිමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකුව මගින් පවත්වාගෙන යනු ලබන ශිෂ්‍යාධාර හා තිළිණ ලබාදීම මෙවරත් අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමා හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්තුමාගේ ප්‍රධානත්වයෙන්,

වරාය සභාපතිතුමා හා උප සභාපතිතුමන්ගේ සහභාගීත්වයෙන් පසුගිය දා මහරගම තරුණසේවා ශ්‍රවණාගාරයේ දී පැවැත් විය.

සමුපකාර බැංකු සාමාජිකයින්ගේ දූවා දරුවන් දිරිගන්වමින් ඇගයීමට ලක් කිරීම මෙහි අභිප්‍රායයි.

දරුවාගේ ගිණුමට රු.5000/- ක මුදල් ත්‍යාගයක් ද, පාසල් ලිපි ද්‍රව්‍ය හා අගනා ජාත්‍යන්තර පොත් කට්ටලයක් ද හිමිකර දීමෙන් සැකසුරුවම් මෙන්ම ගුණ නැණින් පිරිපුන් දරුවන් පිරිසක් මතු පරපුරට දායාද කරදීම මෙම තිළිණ ප්‍රධාන උළෙලේ මුඛ්‍ය අරමුණ විය.

# වරායේ සාහිත්‍ය රස වින්දනයට පියවරක්





අරුණළු හඳගම

වරාය අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ සාහිත්‍ය රස වින්දනය සහ පොත්පත් කියවීම වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙන් සාහිත්‍ය සහ කවි වැඩමුළුවක් පසුගියදා බණ්ඩාරනායක පාලම සුහසාධක ගොඩනැගිල්ලේ දී පැවැත්විණ.

එහිදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපති ගරු පි. ජී. දසනායක මහතා සාහිත්‍ය ඇසුරුකිරීමේ ආභාෂය අද ඔහු දරණ තනතුර සඳහා පැමිණි මග සහ ජීවිතය වර්ණවත් කිරීමට මහගු පිටිවහලක් වූ බව සඳහන් කරන ලදි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සුහසාධක කොට්ඨාශය එම්.ඩී. ගුණසේන සහ සමාගම සමග එක්ව සිදුකළ මෙම කර්තව්‍යයේ දී වරාය සේවක මහත්ම මහත්මීන්ගේ සහ ඔවුන්ගේ දූ දරුවන් හට ඉතාමත් සහනදායී මිලට පොත්පත් ලබා දීමටත්, එමගින් කියවීමේ රුචිකත්වය වැඩිදියුණු කිරීමටත් සාහිත්‍ය රසය වර්ධනය කිරීම මගින් යහපත් සමාජයක් නිර්මාණය කිරීමත් මෙම වැඩසටහනේ අපේක්ෂාව විය.

## මෙවර ශ්‍රී ලංකා වරාය...

03 පිටුවෙන්...

**කොළඹ වරාය ට අමතරව අනෙක් වරායන් සම්බන්ධයෙන් ගෙන ඇති පියවරයන් පිළිබඳව විස්තර කළොත්..?**

ස්වභාවික වරායක් ලෙස ත්‍රිකුණාමල වරාය අපට විශාල සම්පතක් වෙනවා. සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් Yacht Marina එකක් සඳහා ත්‍රිකුණාමල වරාය සුදුසු ම වරායක්. මේ සම්බන්ධයෙන් කෙටිකාලීන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සඳහා දැනටම ත් අවශ්‍ය කටයුතු සිදු කර තිබෙනවා. මීට අමතරව ගාලු වරාය සම්බන්ධයෙන් ද Yacht Marina ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමට ත් ඒ එක්කම අනෙකුත් වරායන් සංවර්ධනය කිරීමේ දී පෞද්ගලික ආයෝජකයින්ගේ සහයෝගය සඳහා අවශ්‍ය යෝජනා කැඳවීමට ත් ක්‍රියාකර තිබෙනවා. ඒ අනුව සමස්තයක් වශයෙන් ගත්කල ආසියාවේ කේන්ද්‍රීය වරාය මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ නාවික ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය මූලික වැඩකටයුතු සියල්ල ආරම්භ කර ඇති බව සඳහන් කළ හැකියි.

**වරාය ක්ෂේත්‍රය තුළ ඔබ දකින නව අත්දැකීම කවරේ ද..?**

කොළඹ වරාය හැඳින්වෙන්නේ "ජාතියේ හදවත" ලෙස යි. එය මගේ අදහසක් නොව සේවක ඔබගේ අදහස යි. එම ප්‍රකාශය තුළින් ම පිළිඹිබු වන්නේ වරායේ ඇති සුවිශේෂත්වය යි. එසේනම් වරාය, වරාය ක්ෂේත්‍රය හා එහි පැවැත්ම රඳා පවතින සේවකයින් රැකගැනීම අපේ ප්‍රමුඛ අරමුණ විය යුතුයි.

මෙතෙක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ට මුහුණදීමට තිබූ බිලියන ගණනක ණය ප්‍රමාණය නිදහස් කරමින් අප ගෙන ඇති නව වැඩපිළිවෙළ යටතේ නිදහස් ව ලාභ ලබන ආයතනයක් ලෙස ක්‍රියාත්මක කිරීමට හැකිවීම අප ලද විශිෂ්ට ජයග්‍රහණයක්.

ඒ සමඟ ම වරායේ පැවැත්ම සුරක්ෂිත කරන සේවක සේවිකාවන් සඳහා වැටුප්, ප්‍රසාද දීමනා හා සුහසාධක සේවාවන් වැඩි කරමින් ජීවන තත්ත්වය ඉහළ නැංවීමට හැකිවීම ද අප ලද තවත් ජයග්‍රහණයක්. මේ තත්ත්වයන් මත වරාය සේවකයන්ගේ සුවතාවය ත්, ඔවුන්ගේ කැපවීම ත් මත වරායේ අනාගතය තවදුරටත් සුරක්ෂිත වන බව මගේ අදහසයි.

# ආරක්ෂක කොට්ඨාශයට තුති මල් මිටක්

පසුගිය දිනක වරාය පරිශ්‍රය තුළ සිදුවීමට ගිය වංචනික කටයුත්තක් වලක්වා ගැනීමට වරාය ආරක්ෂක අංශය සමත් විය. ඔත්තුකරුවකුගේ තොරතුරක් මත වහාම ක්‍රියාත්මක වූ ආරක්ෂක අංශය විදේශීය සිගරට් කාටුන් 36ක් අත්අඩංගුවට ගැනීමට සමත් වූ අතර එහි වටිනාකම මුදලින් රුපියල් ලක්ෂ පහක් පමණ වේ.

සිදුවීමට ගිය අක්‍රමිකතාව වලකමින් ඉදිරි පරීක්ෂණ කටයුතු සිදු කිරීමට වරාය ආරක්ෂක කොට්ඨාශය පියවර ගන්නා ලදී. ආරක්ෂක අධිකාරි කේ.ඩී.ජේ.විජේන්ද්‍ර හා සී.කේ.බී.පෙරේරා යන මහත්වරුන්ගේ උපදෙස් පරිදි සහකාර ආරක්ෂක නිලධාරි එච්.එම්.ඩී.ආර්.කල්‍යාණ මහතා හා ආරක්ෂක සැරයන් එන්.ඩබ්.සිරිවර්ධන මහත්වරුන්ගේ මූලිකත්වයෙන් ආරක්ෂක නියාමක ජනකලාල් ගුනරත්න, එම්.ජේ.එස්.ජයවීර හා එම්.පී.විපුල විතාන යන මහත්වරුන්ගේ සහභාගීත්වයෙන් මෙම මෙහෙයුම සිදුවිය. ඒ සඳහා උරදුන් ආරක්ෂක කොට්ඨාශයේ සියළුම සේවක මහතුන් හට තීර්ථ ප්‍රණාමය පුද කර සිටිමු.

# ප්‍රවාහන අංශයෙන් මනුසත් ක්‍රියාවකට අතහිත





අනුර රූපසිංහ

අප ජීවත්ව සිටින කාලය තුළ සමාජය වෙනුවෙන් යම් මෙහෙවරක් ඉටු කිරීමට හැකි නම් එය අප ලද භාග්‍යයකි. අපි සමාජය තුළ අන්ත අසරණ ජීවිත ගතකරන අය කොපමණ ඇතිද?? එවන් මිනිසුන් වෙනුවෙන් අපට හැකි පමණින් යම් උපකාරයක් කළ හැකි නම් එය ජීවිත කාලය තුළ අපහට සතුටු විය හැකි කරුණක් වනු ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රවාහන අංශයේ සේවය කරන අපහට එවන් සත්කාරයකට දායක වීමට පසුගිය දා හැකි විය. රූපවාහිනී නාලිකාවකින් හෙළිදරව් කළ මාවනැල්ල ප්‍රදේශයේ අන්ත අසරණ පවුලක් වෙනුවෙන් දිරියක් වන්නට අපට හැකි වූයේ ඒ ලෙසිනි. අප එහි සත්‍ය තොරතුරු සොයා ගිය අවස්ථාවේ දී දක ගත හැකි වූයේ ඉතා දුක්මුසු දසුනක්. ඇඳමනට පමණක් සීමා වූ පියෙකු, පස් හැවිරිදි පුංචි දියණියක් හා ඇගේ මිත්තණියත් ගෙවන කටුක ජීවිතය සියලුදෙනාගේ හදවත් උණුකළා. ඔවුනට හරිහැටි හිසට සෙවනක් පවා තිබුණේ නැහැ. ප්‍රවාහන අංශයේ සේවක මහතුන් විසින් කරන ලද නොමසුරු ආධාරය තුළින් පුංචි දියණියගේ ගිණුමට රු.75,500.00 ක මුදලක් බැර කිරීමට හැකි වීම අප සේවක පිරිසගේ හදවත් වලට සතුටු කඳුලක්ම එක් කළා.

**ඔබ කොට්ඨාශයේ, අංශයේ, වැඩ බිමේ, අංගනයේ, සේවක කැල එකතුව ඔබ විසින් සිදු කරනු ලබන සමාජ සත්කාර, විශේෂ වැඩසටහන්, ඵලදායිතා ක්‍රියාකාරකම්, දූවා දරුවන්ගේ නිර්මාණ කුසලතා පිළිබඳව "තීර්ථ" අවකාශයක් ලබාදීමට අප නිරන්තරයෙන් ඇප කැප වී සිටින බැව් ඔබට දන්වන්නේ සතුටිනි.**

**ලියන්න අපට, තීර්ථ සංස්කාරක**

**සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය**

# බහලු මෙහෙයුම් හි ධනාත්මක වර්ධනය උදෙසා නැගෙනහිර පර්යන්තය කඩිනම්ව ඉදිකරනවා

- ආචාර්ය පරාක්‍රම දිසානායක - සභාපති ශ්‍රී ලංකා වරාය අධිකාරිය





ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2018 වර්ෂය සඳහා වැඩ ඇරඹීම පසුගිය දා ආගමික කටයුතු වලට මුල්තැන දෙමින් පැවැත් විණි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සම්බුද්ධ ජයන්ති චෛත්‍ය පරිශ්‍රයේ දී, රාජ්‍ය සේවයේ ප්‍රතිඥාව කියවා රජය ගෙන යන වැඩ පිළිවෙලට සහය දෙමින් ඇරඹි මෙම උත්සව අවස්ථාවේ සභාව ඇමතූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගරු සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා,

2018 වසර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සැමට සුවිශේෂී වසරක් බවත්, 2018 වසර ඇරඹුමේදී ම සැමට සඵලදායි වැටුප් වැඩිවීමකට එළඹෙන බවත් සහෝදර පර්යන්තයන් වන SAGT, CICT දායකත්වයෙන් යුතුව සමුද්‍රික ක්ෂේත්‍රයේ ගෝලීයකරණය හා තරඟකාරීත්වයට මුහුණදීමට අපේක්ෂා කරන බවත්, එහිදී වරාය අධිකාරියේ සියලු ක්ෂේත්‍රයන්ගේ ඵලදායිතාවය තවදුරටත් වැඩි කිරීමට සියලු සේවක මහත්ම මහත්මීන්ගේ මනා කාර්යක්ෂම සේවාව ඉතා වැදගත් බවද පැවසීය. මේ වසර තුළ නව මානව සම්පත් සැළැස්මක් ඔස්සේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මානව සම්පත් සංවර්ධනයට ද අවකාශය සලසා ඇති බවත්, බහලු මෙහෙයුම් හි ධනාත්මක වර්ධනය උදෙසා නැගෙනහිර පර්යන්තය කඩිනම්ව ඉදිකරන බවත් පැවසී ය.

වැඩිදුරටත් කරුණු දක්වූ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා,

ගෙවීගිය 2017 වර්ෂය ශ්‍රී ලංකා වරාය අධිකාරියට සංධිස්ථාන රැසක් හිමිකර දුන් වර්ෂයක් බවත් අධික ණය බරකින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මුදවා ගැනීමට ගරු වරාය හා නාවික කටයුතු අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමාගේ නායකත්වය හමුවේ හැකිවීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලැබූ සුවිසල් ජයක් බවත් පැවසී ය.

තවද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජය බහලු පර්යන්තය SAGT, CICT මෙහෙයුම් අංශයන්හි කාර්යක්ෂමතාවය සමගින් 2017 වසර තුළ බහලු මෙහෙයුම් මිලියන 06කට අධික ප්‍රමාණයක් මෙහෙයවීමට කොළඹ වරායට හැකියාව ලැබීම සතුටට කරුණක් බවත්, ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ ය. නාවික ක්ෂේත්‍රය තුළ කේන්ද්‍රීය වරාය බවට පත් වෙමින් දකුණු ආසියානු කලාපය තුළ ප්‍රථම ස්ථානය දිනා ගැනීමට ද කොළඹ වරායට හැකියාව ලැබුණු අතර, ඒ සඳහා කළමණාකාරීත්වයේ මෙන්ම සියලුම සේවක මහත්ම මහත්මීන්ගෙන් ලද උත්සාහය හා කැපවීම ඉතා අගය කොට සලකන බවත් හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ ය.

# මාගම්පුර වරාය ආයෝජනයේ කොටස් මුදල් වරාය අධිකාරියට




හම්බන්තොට වරාය සංවර්ධනය සඳහා වන ආයෝජනය වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා චයිනා මර්චන්ට් පෝර්ට් හෝල්ඩිංග්ස් සමාගම 2017 දෙසැම්බර් 09 වැනි දින සහන ගිවිසුමකට අත්සන් තබන ලදී. රාජ්‍ය හා පුද්ගලික ව්‍යාපාරයක් (PPP) ලෙස ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය සඳහා හිමිකම් භාරයේ ප්‍රථම අදියරේ දී ඇමරිකානු ඩොලර් මිලියන 389.462ක මුදලක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලබා දුන් අතර, එහි ඉතිරි මුදල වන ඇමරිකානු ඩොලර් මිලියන 97.365ක මුදල 2018 ජනවාරි 08 වැනි දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත භාර දීම සිදු වි ය.

මෙම අවස්ථාවේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති පරාක්‍රම දිසානායක මහතා තම අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ ''CM Port" සමාගම වරාය ක්ෂේත්‍රයේ ඉතා දැවැන්ත සමාගමක් වන අතර, ඔවුන් හම්බන්තොට වරාය තුළ ආයෝජනයට එකඟවීම ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි විශිෂ්ඨ විශ්වාසයක් තබා කළ කාර්යයක් ලෙස විග්‍රහ කළ හැකි බවයි.

මෙම ව්‍යාපෘතිය සඳහා සමාගම් දෙකක් පිහිටවූ අතර, ඒ යටතේ පළමු හා දෙවන අදියර වෙනුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 600ක් ආයෝජනය කරන අතර, අතිරේකව තවත් ඇමරිකානු ඩොලර් මිලියන 400ක් ද ආයෝජනය කෙරේ. එමෙන්ම 2018-19 වසර තුළ තවත් විදේශීය ආයෝජකයන් ශ්‍රී ලංකාව වෙත ආකර්ශනය වීමෙන් ශ්‍රී ලංකාව නුදුරේ දීම එහි ඉලක්කගත සමුද්‍රීය හා සේවා සැපයුම් මධ්‍යස්ථානයක් බවට පත්වීම යථාර්තයක් බවට පත්වනු ඇත.

# කොළඹ වරාය - ටියුටිකොරින් වරාය අතර RCL පෝෂක නැව් සේවාව ඇරඹේ




RCL පෝෂක නැව් සේවාව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජයබහලු පර්යන්තය සමග එක්ව සේවා කටයුතු ඇරඹීම පසුගියදා සිදුවිය.

ඉන්දීය තමිල්නාඩු ප්‍රාන්තයේ දෙවන විශාලතම වරාය වන ටියුටිකොරින් වරාය හා කොළඹ වරාය අතර සඳුදා සහ සිකුරාදා යන දිනයන්හි සතියකට ගමන්වාර දෙක බැගින් ඇරඹෙන මෙම පෝෂක නැව් සේවාවේ සමාරම්භය සනිටුහන් කරමින් බහලු 1730 (TEUS) ධාරිතාවයෙන් යුතු MV charlie නෞකාව කොළඹ වරායේ ජයබහලු පර්යන්තයට පැමිණීම පසුගියදා සිදුවිය.

මෙම සුවිශේෂිත අවස්ථාව සනිටුහන් කරමින් පැවති උත්සව අවස්ථාවේ විශේෂ ඵලක හුවමාරුවක් ද සිදු වූ අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරිය නියෝජනය කරමින්, ප්‍රධාන කළමණාකරු (අලෙවි හා වෙළෙඳ ප්‍රවර්ධන) උපුල් ජයතිස්ස මහතා සහ නෞකාවේ කපිතාන් ඔලෙග් අනශ්කින් (Oleg Anashkin) මහතා අතර මෙම ඵලක හුවමාරුව සිදු විය.

# තිසා වැව් ඉස්මත්තේ ඉදිවන අපේ නිවාඩු නිවහන









කතරගම පුදබිම වැඳපුදා ගන්නට ගිය මොහොතක, සුන්දර නුවරඑළියේ සීත කඳු යාය අතරේ සිසිලස සොයා ගිය මොහොතක අපේ ම කියා නතර වන්නට වරාය සේවක සැම දෙනාට ම සොඳුරු නවාතැන් තිබෙනවා. වරක් නොව කිහිපවරක් ම ඔබ මේ වන විටත් එම පරිශ්‍රයන් හි ඔබේ පවුලේ ළබැඳියන් සමගින් විවේක සුවයෙන් කල් ගත කළ බව අපි දන්නවා.

ශ්‍රී ලංකාවේ මුල් ම රාජධානිය වුණු අනුරාධපුර පූජා භූමියේ වන්දනාවක, විනෝද චාරිකාවක ගිය මොහොතක දී ත්, ගෙදර වගේ ම හිතට දැනෙන අපේ ම තැනක නවාතැන් ගන්නට හැකි නම් ඔබ කොයි තරම් සතුටු වේවි ද?

ඔබේ ඒ සිහිනය යතාර්ථයක් කරන්නට අවැසි අඩිතාලම දමන්නට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බෞද්ධ සංගමය ට පසුගිය දිනෙක හැකියාව ලැබුණා. ඒ පියවර දෙකක් යටතේ අනුරාධපුර, ලෝලුග ස්වැව මංසන්ධියේ ඉදිකිරීමට නියමිත නිවාඩු නිකේතනයට මුල් ගල් තැබීමත් සමගින්. නිවාඩු නිකේතනයට මුල් ගල් තැබීම වරාය හා නාවික ගරු නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම, වරාය අධිකාරියේ උප සභාපති පී.ජී. දසනායක යන මහත්වරුන්ගේ සුරතින් සිදුවුණා.

අනුරාධපුර තන්තිරිමල මාර්ගයේ තිසා වැව් ඉස්මත්තේ ම සොඳුරු වටපිටාවක ඉදිවන මෙම නිවාඩු නිකේතනයෙහි බිම් මහල කාමර 04කින් හා ශාලා 02කින් ද, දෙවන මහල කාමර 06කින් ද සමන්විත වෙනවා. මේ පුණ්‍ය භූමියේ, අනුරපුර පූජා නගරයේ ඔබ වෙනුවෙන් ම ඉදිවන මෙම සොඳුරු නිවහනේ පළමු අදියර 2018 පොසොන් පෝය දින දී විවෘත කිරීමට අපේක්ෂිතයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බෞද්ධ සංගමයේ ගරු සභාපති කොටුව බෝධිරාජ විහාරාධිපති පූජ්‍ය නිකුල පඤ්ඤාසාර නා හිමියන්ගේ අනුශාසකත්වය යටතේ, බෞද්ධ සංගමයේ ගරු ලේකම් අධ්‍යක්ෂ (සේවා සැපැයුම්) උපාලි සොයිසා මහතාගේ හා සංගමයේ සාමාජික මහත්ම මහත්මීන්ගේ අව්‍යාජ කැපවීමක ඵලයක් ලෙසිනුයි මෙම නිවාඩු නිකේතනය ඔබ අතට පත්වීමට නියමිත වන්නේ. ඉතින් ලබන පොසොන් පෝයට අනුරාධපුර එන ඔබට, ඔබේ ම ප්‍රියයන් සමගින් ඔබේම තැනක නවාතැන් ගන්නට අභිනවයෙන් ඉදිවන මෙම නිවාඩු නිකේතනය සුවදායි නිවහනක් වනු නොඅනුමානයි.

## ප්‍රථම වතාවට ජපන් විදේශ අමාත්‍යවරයෙකු කොළඹ වරායට පැමිණෙයි



ශ්‍රී ලාංකේය වරාය ඉතිහාසයේ ප්‍රථම වතාවට ජපාන විදේශ අමාත්‍යවරයෙකුගේ ආගමනය සනිටුහන් කරමින් ජපාන විදේශ අමාත්‍ය ටාරො කොනො මැතිතුමා පසු ගිය දා කොළඹ වරායේ විශේෂ නිරීක්ෂණ චාරිකාවක නිරත වි ය. වසර 15 කට පසුව ජපාන විදේශ අමාත්‍යවරයෙකු මෙරටට පැමිණීම සුවිශේෂ කරුණක් වන අතර, ශ්‍රී ලංකාව හා ජපානය අතර විශිෂ්ට වෙළඳ සබඳතාවක් මෙතුලින් ගොඩනැගෙනු ඇත. කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය හා නියමු මධ්‍යස්ථානය (Pilot Station) ද එතුමාගේ නිරීක්ෂණයට ලක් වි ය.

කොළඹ වරාය මේ වන විට අත්කර ගෙන ඇති ප්‍රගතිය ජපාන විදේශ අමාත්‍ය ටාරො කොනො මැතිතුමාගේ විශේෂ ඇගයුමකට ලක් වූ අතර, මෙහි දී අදහස් දැක් වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා, සමුද්‍රීය කලාපයේ කේන්ද්‍රීය නාවික මධ්‍යස්ථානයක් බවට පත් වීමට කොළඹ වරාය සතු පිහිටීමේ උපාය මාර්ගික ශක්‍යතාව මෙන් ම වරාය හා නාවික කටයුතු අමාත්‍ය මහින්ද සමරසිංහ මහතාගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය මේ වන විට තුන් අවුරුදු සැලැස්මක් සකස් කොට ඇති බවත්, ඒ මගින් ඉදිරි කාලය තුළ දී සංවර්ධන කටයුතු වඩාත් වේගවත්ව ඉදිරියට ගෙන යාමට හැකි බවත් ජපාන විදේශ අමාත්‍යවරයාට පැහැදිලි කළේ, නව පර්යන්ත ඉදිකිරීම ඇතුළු පුළුල් යටිතල පහසුකම් ක්‍රියාදාමය කොළඹ වරාය තුළ ස්ථාපිත වීම පිළිබඳ එතුමාගේ විශේෂ අවධානයට ලක්කරමිනි.




## 2017 වර්ෂයේ අග කාර්තුවේ සිට ජයබහළු පර්යන්තයේ බහලු මෙහෙයුම්වල අඛණ්ඩ වර්ධනයක්

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජයබහලු පර්යන්තයේ බහලු මෙහෙයුම් ධාරිතාවයේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරයි. 2017 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිට වර්ධනය වෙමින් පවතින මෙම බහලු මෙහෙයුම් වර්ධනය පසුගිය ඔක්තෝබර් මස සියයට 5.3 % කින්ද, නොවැම්බර් මස 8.2% කින්ද, දෙසැම්බර් මස වන විට 13.9% ලෙස කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරයි. මේ වන විට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජය බහලු පර්යන්තයේ ඵලදායිතාව පෝෂක නැව් සඳහා (Feeder line) 3.2% කින්, පෝෂිත නැව් (Main line) සඳහා 9.4% කින් ද කැපී පෙනෙන ලෙස වර්ධනය වී තිබේ.

2015 සහ 2016 සහ වර්ෂවල දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් පාලනය වන බහලු මෙහෙයුම් පර්යන්තවල බහලු මෙහෙයුම්වල අඩුවීමක් දක්නට ලැබුණු අතර, එය 2017 වර්ෂයේ තුන්වන කාර්තුව තෙක් පැවතුනි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ජය බහලු පර්යන්තයේ මේ සා සුවිසල් ජයග්‍රහණයෙහිලා වත්මන් රජයේ වරාය හා නාවික ගරු අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමාගේ විශිෂ්ඨ නායකත්වයත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතාගේ නිසි මඟපෙන්වීම හා කළමණාකාරීත්වයත්, වරාය මෙහෙයුම් ක්‍රියාවලියට සම්බන්ධ සියළුම පාර්ශවයන්ගේ යහපත් දායකත්වය හා වෘත්තීය සමිති මෙන්ම සමස්ථ වරාය සේවකයන් අතර පැවති සහ සම්බන්ධතාවය ඉතා ප්‍රශස්ත ලෙස වර්ධනය වී තිබීම ද තුළින් මෙවන් කඩිනම් සංවර්ධනයක් කරා ළඟා වීමට හේතු වී තිබේ.

එමෙන්ම, මේ වන විට ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් තුන් අවුරුදු සංවර්ධන සැළැස්මක් සකස් කර ඇති අතර ඒ මගින් ඉදිරි කාලය තුළදී සංවර්ධන කටයුතු වඩාත් වේගවත්ව ඉදිරියට ගෙන යාමටත්, ඒ තුළින් බහළු මෙහෙයුම් තවදුරටත් ඉහළ නංවමින් කොළඹ වරාය ආසියාවේ කේන්ද්‍රීය වරායක් බවට පත්වනු ඇත.

# දකුණු ලකේ ලක් මව බබලන තැල්ල
# ගාලු වරායයි සිරියා දෙන නිල්ල

## තතු බිඳක් පළමුව

සංවර්ධන ක්‍රියාවලියක සුභ නිමිති සිතේ දරාගෙන එදා මෙදා තුර ගලා ගිය කාලය අති මහත්‍ය. ඉවසීම කෙසේ දැඩි වූවත් දැන් දැන් ගාලු වරාය සඳහා ඇති ඉදිරිය ගැන සැක සිත් පහල වීම වැළැක්වීම උගහටය. එසේ හෙයින් තවමත් ගාලු වරායට ඇලුම් කරන, ගාලු වරාය වෙනුවෙන් දිරිය දරණ සියළුම දෙනාගේ හිතසුව පිණිස වදන් පෙළක් තැබිය යුතු කාලය එළඹ ඇති බව ප්‍රත්‍යක්ෂය.

සොබාදම් මැණියගේ මහත් ආශිර්වාදයෙන් වරායක් සඳහාම සුදුසුවන පරිදි රට තුලට නෙරා ගිය හෙක් 350 ක් පමණ විශාල සමුද්‍ර භූමියක් සහිත මෙම අද්විතීය පිහිටීමෙන් අද ගාලු වරාය ලෙස සිය අයිතිය තුළ රැඳවී ඇත්තේ ගොඩබිමින් හෙක්. 51 ද, සමුද්‍රයෙන් හෙක් 20 ක් ද තරම් වූ කුඩා ප්‍රදේශයක් වන අතර, ඉණුදු ගාලු වරාය ලෙස සැබවින්ම සිය මෙහෙයුම් කටයුතු සඳහා සක්‍රීයව ප්‍රයෝජණයට ගෙන ඇත්තේ මාගාල්ල තුළ පිහිටි ගොඩබිමින් හෙක්. 16.146 ක් වූ ද සමුද්‍රයෙන් දැනට භාවිතා වන හෙක්. 20 ක් වූ ද සුළු වපසරියයි.

ඇත්ත වශයෙන්ම මෙම භාවිතය වරාය අධිකාරිය සතු මුළු ගොඩබිම් ප්‍රමාණයෙන් 31.4% ක් පමණ වන අතර භාවිතා කළ හැකි මුළු සමුද්‍රීය භූමි ප්‍රමාණයෙන් භාවිතා කරන ප්‍රමාණය 5.7 % ක් පමණ වූ ද ප්‍රතිශතයකි.

ඉදින් මෙම විශාල භූමි ප්‍රමාණයක මනා ලෙස ප්‍රයෝජනයට ගත හැකි වන සේ සැකසුණු ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය යළි පණ ගැන්වීමේ භාග්‍යමත් පියවර නව අවුරුද්දත් සමග ඇරඹිය යුතු බව රටේ සමෘද්ධිය උදෙසා කළ යුත්තක්ම ය.

සේද මාවතට ඉතා ආසන්නව දකුණු ලක අගනුවර මනරම් භූමි භාගයක පිහිටා ඇති මෙම ගාලු වරාය 130 m ක පළල පිවිසුම් මාර්ගයකින් ද (Entrance Chanel) 300 m ක දිග හා 200 m ක පළල තරම් වූ සමුද්‍ර තටාකයකින් ද (Sea Basin) යුක්ත වෙයි. ප්‍රධාන ජැටිය වන ක්ලොසන්බර්ග් ජැටිය 423 m පමණ දික් වන අතර 8 m පමණ ගැඹුරින් යුක්තය. විශාල පයිල් බස්සවා කේබල් මගින් ගොඩබිමට ඇද සාදන ලද විශ්මිත ඉංජිනේරුමය නිර්මාණයක් වන මෙම ජැටිය ආචාර්ය කුලසිංහ ඉංජිනේරු මහතා විසින් නිර්මිත අදත් ප්‍රධානතම මෙහෙයුම් සඳහා භාවිතා කරන විශාල ආදායමක් ලබා දෙන පියරයකි. 7.5 m ක පමණ ගැඹුරක් සඳහා නැංගුරම් කළ හැකි මෙහි (Lo A ) දිග 128 m වූ ටොන් 10,000 ඉක්මවන ක්ලින්කර් නැව් මෙහෙයුම් සඳහා දිගින් දිගටම භාවිතා කරයි. මෙබදු නැව් 03 ට පියරය දිගේ නැංගුරම් දැමිය හැකි ලෙස ඉඩකඩ පහසුකම් ඇති මෙම ක්ලොසන්බර්ග් ජැටිය තුළ මුන්ඩායි ගෑස් සමාගමට අයත් නඩුමගට බැසගත් ගෑස් නෞකාව දීර්ඝකාලීනව නවතා දැමීම නිසා ජැටියේ සම්පූර්ණ දිගම මෙහෙයුම් සඳහා යොදාගත නොහැකිවීම ඉමහත් පාඩුවකි.

මෑත කාලයේ සාදන ලද 164 m දිග හා 82 m ක හරස් ජැටියක් ද සහිත නව පියරය (New pier) වරාය ඉංජිනේරුවරයන්ගේ උපදේශකත්වයෙන් චීන සමාගමක් මගින් ඉදිකර ඇති අතර, සමුද්‍ර තටාකය දෙසට 8 m සිට ධීවර වරාය දෙසට 4 m දක්වා වූ වෙනස්වන ගැඹුරකින් යුක්තය. මෙම ජැටිය පයිල් බස්සවන ලද පදනමක් මත ඉදිකර ඇති අතර, නොයෙකුත් පරාසයන්ගෙන් යුත් නෞකා හා යාත්‍රා සඳහා ඉඩ පහසුකම් ලබා දෙයි.

Yacht marina ලෙස මෑතකදී සාදා නිමවන ලද කුඩා රුවල් යාත්‍රාංගනය 3.4 m පමණ ගැඹුරකින් යුතු අතර දැනටත් කුඩා රුවල් යාත්‍රා සඳහා පහසුකම් සපයයි. ඉදිරියේ දී තවදුරටත් ප්‍රවර්ධනය කර භාවිතා කිරීම සඳහා ආයෝජකයන් දිරිමත් කරන අතර ආයෝජකයින් හරහා වඩාත් ගුණාත්මක සේවාවක් ලබාදීමට ද බලාපොරොත්තු වෙයි.

## ලාභ ලැබීම හැරවුම් ලක්ෂය 2014

වර්තමානයේ ගාලු වරායේ ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ INSEE තායිලන්ත සමාගම මගින් ගෙන එන ක්ලින්කර් (Clinker) නැව් මෙහෙයුමයි. පෙර ගාලු වරාය පාඩු ලබන ආයතනයක් බවට පත්ව තිබුණ ද 2014 වර්ෂයේ සිටම ලාභ ලැබීම සඳහා ක්ලින්කර් නැව්වල පැමිණීමේ ප්‍රවර්ධනය සෘජුවම බලපෑ බව නොරහසකි. ත්‍රිකුණාමල වරායට පැමිණෙන මව් යාත්‍රාව වන (Mother vessel) කාංචනා නාරී සිට ලීලා හා සෝබා නමැති සොඳුරු යාත්‍රා දියණියන් (daughter vessels) ඔස්සේ එන මෙම ක්ලින්කර් INSEE ආයතනය (CIAM cement) මගින් නැවකින් නැවකට මාරුකිරීමේ (Ship to ship transfer) පිළිවෙතින් ගෙන එන බැවින් වරායවල් දෙකෙහිම ආදායම් ඉහළ නැංවීමට හේතු වී ඇත. දැනට මසකට ක්ලින්කර් නැව් 6-7 දක්වා ප්‍රමාණයක් පැමිණෙන අතර 2016 වසර සඳහා පැමිණි මුළු යාත්‍රා 162 න් ක්ලින්කර් නැව් ගණන 77කි.

එසේම OPL සේවාවල (Out Port Limit services) වර්ධනයද මේ සඳහා යම්කිසි ප්‍රමාණයක දායකත්වයක් ලබා දී ඇති බව කිව යුතුමය. OPL සේවාව යනු මුහුදු මංකොල්ලයන් බහුල මුහුදු සීමා කලාප හරහා යන නැව් සඳහා ආරක්ෂිත සේවා කණ්ඩායමක් OPL යාත්‍රා මගින් ඈත මුහුදේ දී ලබා දීමත් එම මුහුදු මංකොල්ලයන් බහුල කලාප පසුකර පැමිණෙන නැව්වලට එම ආරක්ෂිත සේවාව දී අවසන් බැවින් නැවත OPL යාත්‍රා මගින් ආරක්ෂිත කණ්ඩායම් ගොඩබිමට ගෙන ඒමත් ය.

2014 වර්ෂයේ දී මෙම OPL services ගණනද 11,461 ක උපරිමයකට පැමිණ ඇති අතර, එය ඉන්පසු ක්‍රමක්‍රමයෙන් අඩුවී ඇති බව පෙනී යයි. මෑත ඉතිහාසයේ 2008 න් පසු ගාලු වරායේ ආදායම් වියදම් සැසඳීමේ දී 2008 වසරේ දී ලැබුණු මුළු ආදායම රු. මිලියන 314 කි. ගෙන්වන ලද කාගෝ ප්‍රමාණය ටොන් 394,802 ක් වන අතර, පැමිණෙන ලද මුළු නැව් හා යාත්‍රා ප්‍රමාණය 35 කි. මුළු ලාභ අලාභ සැසඳීමේ දී 2008 වර්ෂයේ දී ලබා ඇති මුළු අලාභය රු. මිලියන 278 කි. 2014 වසරේ දී වසර ගණනාවකට පසුව ලැබූ පළමු ලාභය රු. මිලියන 95 ක් වන අතර, මෙහෙයුම් කරන ලද කාගෝ ප්‍රමාණය 393,977 කි. පැමිණෙන ලද මුළු නැව් ප්‍රමාණය 45 කි. ගාලු වරායේ කාගෝ ප්‍රමාණය 2014 දී දී සුළු ප්‍රමාණයක (ටොන් 825) අඩුවීමක් පෙන්නුම් කළත් පැමිණෙන මුළු යාත්‍රා ප්‍රමාණයේ වැඩිවීමත් OPL Services වල වැඩිවීම උපරිම වීමත් මෙහෙයුම් Tarrif වල කරන ලද වෙනස්කම් යන නොයෙකුත් සාධක හේතු කොට ගෙන ලාභ ලැබීමේ හැරවුම් ලක්ෂයක් වෙත 2014 වසරේ දී පැමිණ ඇති බව හෙළිදරව් කරමි. 2016 වසර තුලදී පෙන්වන මුළු ආදායම රු. මිලියන 1239 ක් වන අතර ලබන ලද ශුද්ධ ලාභය රු මිලියන 497 ඉක්මවන්නේ ගෙනෙන ලද මුළු කාගෝ ප්‍රමාණය ද ටොන් 762, 286 ක් දක්වා ද වර්ධනය වීමත් පැමිණෙන ලද මුළු යාත්‍රා ප්‍රමාණය 83 ක් දක්වා වැඩිවීමත් සමඟින් වන බව පවසන්නේ ඉමහත් සතුටකිනි. 2016 වසරේ දී වරාය ලද ශුද්ධ ලාභය 2014 වසර හා සසඳන විට පස් ගුණයකටත් වඩා වැඩි වන අතර එය 2015 වසර හා සසඳන විට තුන් ගුණයකට වඩා වැඩිය.

ඉදින් මෙම මෙහෙයුම් හා පහසුකම් සැපයීම සඳහා ඇප කැප වෙන ගාලු වරායේ සියළු අංශවල ශ්‍රමාභිමානී සේවක මහතුන් සඳහා ද ප්‍රශංසා ශීර්ෂ ප්‍රණාමයක් ලබා දිය යුතු බව කිව යුතුමය.

මතු සම්බන්ධයි...





සටහන
සුභානී නානායක්කාර
(සිවිල් ඉංජිනේරු-ගාල්ල වරාය)



# කේන්ද්‍රීය වරායක හෙට දවස

ටොලමිගේ ලොව ඉපැරණිතම ලෝක සිතියමෙහි ශ්‍රී ලංකාව, ඉන්දියාවටත් වඩා විශාල රාජ්‍යයක් ලෙස නිරූපිතය. දේශාන්තරණයෙහි නිමග්න වූ පුරාතන නාවිකයන්ගේ දැනුම් පද්ධතියන්ගෙන් නිර්මාණය වූ මෙම සිතියමෙහි ශ්‍රී ලංකාව කෙරෙහි එවන් සුවිශේෂී වැදගත්කමක් ලබා දීමට පදනම වන්නේ අන් රාජ්‍යන්ට සාපේක්ෂව භූගෝලීයව වශයෙන් අප රට කේන්ද්‍රීය ස්ථානයක පිහිටා තිබීම යි.

ශ්‍රී ලංකාවේ පිහිටීමට භූගෙ ෝලීය වශයෙන් සමකළ හැකි වෙනත් රාජ්‍යයක් ලොව නොමැත. අධ්‍යයතන ගෝලීයකරණය (Globalization) මගින් සිදුවූ ආර්ථික රටාවේ ගතිකත්වයත් සමග මෙහි වානිජ වටිනාකම දිනෙන් දින ඉහළ යයි. ලෝකයේ සියලු රාජ්‍යයන් යා කරන ප්‍රධාන නාවුක ගමන් මග ශ්‍රී ලංකාව ආසන්නයෙන් වැටී තිබීම ලෝකයා අභිමුඛයෙහි අප රටෙහි පවත්නා කේන්ද්‍රීයභාවය තව තවත් තීව්‍ර කරයි.

2025 වන විට ලොව ප්‍රබල බලවත්ම ආර්ථිකය හොබවන බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය හා දකුණු අප්‍රිකාව (BRICS Nations) යන රාජ්‍යයන් සම්බන්ධ වන ප්‍රධාන නාවුක ගමන් මග ද ශ්‍රී ලංකාව ආසන්නයෙන් වැටී තිබේ. ලෝක ජනගහනයෙන් හරි අඩකටත් වඩා, එනම් බිලියන 3.6 ක ජනතාවක් මෙම රාජ්‍යයන් ආශ්‍රිතව ජීවත් වේ. තවද, වර්තමානයේ ගෝලීය ආර්ථිකයේ ප්‍රබලතම මෙහෙයුම්කරුවා වන්නේ ආසියාවයි. ඉන්දියන් සාගරය ලොව වැදගත්ම සාගරය බවට පත්ව තිබේ. එමෙන්ම, ඉන්දුනීසියාව හා ඉරාකය අතර කලාපය ලොව ගුවන් හා නාවුක ගමන් වැඩිම කලාපය බවට පත්ව තිබේ. එබැවින් අනාගත ගෝලීය ආර්ථික ක්‍රියාවලිය තුළ භාණ්ඩ සංරක්ෂණයේ කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත්වනු නොඅනුමානය.


එවන් වපසරියක් තුළ සේද මාවතේ සමුද්‍රීය සේවා සැපයුම් විශිෂ්ඨතමයා බවට පත්වීමේ ශක්‍යතාවය අප සතු වන්නේ සියලු පහසුකම්වලින් යුතු කේන්ද්‍රීය වරායන් (Hub Port) අප සතුවීමත් මත ලෝක බැංකු වාර්තාවන්ට අනුගතව කේන්ද්‍රීය වරායක පහත ලක්ෂණ අන්තර්ගත විය යුතුය.

- නාවික ගමන් මාර්ගයන්ට හා පෝෂණ වරායන්ට සමීපව පිහිටා තිබීම.
- මහා පරිමාණ නැව් හැසිරවීමේ හා ඒවාට පහසුකම් සැපයීමේ ශක්‍යතාවය.
- කාර්යක්ෂමතාවයකින් බහලු මෙහෙයුම් සිදුකිරීමේ ශක්‍යතාවය.
- භූගෝලීය සීමාවන් තුළ පෝෂණ සේවා සැපයීමේ ශක්‍යතාවය.
- විකල්ප මෙහෙයුම් ගාස්තු.
- ගුවන් හා අභ්‍යන්තර ප්‍රවාහනය කිරීමේ ශක්‍යතාවය.

උක්ත ලක්ෂණ පිළිබඳව විශ්ලේෂණය කිරීමේ දී ගම්‍ය වන්නේ කේන්ද්‍රීය වරායක් ලෙස අප වරායේ පරිසාධික මට්ටම සාධනීය වන බවයි. මේ වන විටත් ලෝක වරාය ශ්‍රේණිගත කිරීමේ තුළ 23 වන ස්ථානය දිනා ගැනීමට හැකියාව ලැබී ඇත්තේ වරායක් ලෙස JCT (Jaya Container Terminal), UCT (Unity Container Terminal), SAGT (South Asia Gateway Terminal) හා CICT (Colombo International Container Terminal) යන සියලු පර්යන්තයන්ගේ (Terminal) සහයෝගීතාවය, කාර්යක්ෂමතාවය හා මානව සම්පත්හි ඵලදායිතාවයත් තාක්ෂණික භාවිතයත් තුළිනි. තවමත් සංවර්ධිත මට්ටමෙහි පවතින ECT පර්යන්තය (East Container Terminal) බහලු මෙහෙයුම් හැසිරවීම සඳහා එක් කිරීම ගෝලීය තරගකාරිත්වය හමුවේ අත්‍යාවශ්‍ය කරුණකි. වරායක් ලෙස කොළඹ වරාය ජාත්‍යන්තර ය හමුවේ ඔසවා තැබිය හැකිවන්නේ එවිටය.

**සටහන**
**චතුෂ්කා ජීවන්ති**

# කොක්කේ කතාව




**සටහන - නිමල් ජයතිස්ස**
**(ප්‍රධාන කළමණාකරු-සුභසාධක හා කාර්මික**

හුක් (HOOk) එකක් යනුවෙන් සඳහන් කළහොත් එක්වරම ඔබේ මතකයට නැගෙන්නේ කෙළවර කවාකාරව නැවුනු ලෝහයෙන් නිර්මාණයවූ කොක්කකි. මෙය යමක් සම්බන්ධ කිරීමට, නැවීමට, එසවීමට හෝ ඇදබැඳ තබා ගැනීමට උපකාරී වේ.

අද සමාජයේ ව්‍යවාර භාෂාවෙන් ''කොක්කක් ඇද ගන්නවා'' යන්නෙන් අර්ථවත් වන්නේ අඩදබරයක් හෝ කලකෝලාහලයක් පටන් ගන්නවා යන්නයි. ''BY HOOk OR BY CROOK '' යන්න කොක්කෙ-න් හෝ කෙක්කෙන් අර්ථවක් වන්නේ හොඳින් හෝ නරකින් යම්කිසි දෙයක් ඉටු කරනවා යන්නයි. මේ හුක් (HOOk) එකක ආරම්භක අවධිය සේ අපට දක්නට ඇත්තේ කාන්තා ඇඳුමේ මූලික ආයිත්තමක් ලෙසටයි.

(HOOk) එකක් නිරන්තරයෙන්ම තවත් වස්තුවක් හෝ පාර්ශවයක් සමඟ සම්බන්ධ කිරීමට යොදා ගන්නකි. එහෙත් වරායකදි නම් හුක් (HOOk) එකක් යනුවෙන් හඳුන්වනුයේ වරාය සේවකයන් සීනි, සහල්, පිටි, සඳහා හුක්(HOOk) එකක අවශ්‍යතාවය අනිවාර්යය වී තිබුණි. එහෙත්, වර්තමානයේ පොලිතින් මලු සඳහා හුක්(HOOk) භාවිතය අවම කර ඇත.

සාම්ප්‍රදායික නෞකා මෙහෙයුම් කිරීමේ දී හුක් (HOOk) එක විශේෂත්ව ගණයේ ලා සැලකේ. එනම්, වරාය මෙහෙයුම් කටයුතුවදී දියත් හා වාප්පු යනුවෙන් අංශ දෙකක් ඇති අතර, නෞකාවේ සිට ගොඩබිම (වාප්පු) දක්වා නෞකාවෙන් ගෙනන භාණ්ඩ රැගත් සිලිංගය හුක් (HOOk) එකන් නිදහස් කරන තෙක් වගකීම හා අයිතිය පැවරෙන්නේ දිවත් අංශයටයි. නැතිනම් නෞකාවයි මෙහෙයුම් ක්‍රියාවලියේ දී හුක් (HOOk) එක එක්තරා සන්ධිස්ථානයක් හෝ කඩඉමක් ලෙසට ද සැලකිය හැකිය. භාණ්ඩ ගොඩබෑම හා පැටවීම සඳහා හුක් එකකින් ඉටුවන කාර්යභාරය හා ප්‍රභේද තීරණය වන්නේ එය ඔසවන භාණ්ඩවල බර ප්‍රමානය අනුවයි. ටොන් 1ක සිට මෙට්‍රික් ටොන් 3000 ක් එකවර එසවිය හැකි හුක්(HOOk) සහිත නෞකාවක් ලෝකයේ ඇති බවට කදිම නිදසුනක් නම් මෑතකදි කොළඹ දකුණු වාරයේ නැගෙනහිර පර්යන්තයේ (ECT) නැංගුරම්ලා තිබු '' SWIBER PJW 300 '' ඩොක් නෞකාවයි. ඒ අනුව කුඩා නෞකාවක් වුවද එසවිය හැකි දොඹකර සහිත හුක් (HOOk) අද ලෝකයේ දක්නට ඇත.

# අන්තර්ජාතික අනුබද්ධිත වරාය ජාලයේ වරායයන් වල තතු

(පළමු දිගහැරුම)

චිත්තාකර්ශනීය වූ වටපිටාවක ස්වභාවිකත්වයෙන් අනූන වූ මොක්පෝ නගරයට මායිම්ව පිහිටා ඇති මෙම වරාය සැමට බහුකාර්ය සේවාවන් සපයන සොඳුරු නැවතුම්පළකි. කොරියාවෙහි පිහිටි බහුකාර්යක් වරායක් වන මෙහි ටොන් 30,000 ක ප්‍රමාණයේ පැනමැක්ස් නෞකාවන්ට ඉඩ පහසුකම් සලසන අතර සාම්ප්‍රදායික නැව් වඩු මෙහෙයුම් මිලියන පහ ඉක්මවන අතර බහලු මෙහෙයුම් වාර්ෂිකව බිලියන 30.1 ක් සිදු කරයි. ''ඩැඩෝ'' (Dado) සාගර දූපත් සමූහයට පෙරබිම් වූ නව නිර්මාණ ගණයෙහිලා සැලකෙන මෙම වරාය වාණිජමය හා විවිධ සංස්කෘතිකාංගයන්ගෙන් අනූන සංචාරක පාරාදීසයක් බවට පත්ව ඇති අයුරු වර්තමානයේ දකගත හැකිය.

මෙම මොක්පෝ වරාය වටා අතිවිශාල වූ උපකාරක සේවාවන් ද පවතියි. දනට චීනයට එරෙහිව නිරිතදිග මොක්පෝ වරාය සිඝ්‍ර දියුණුවක් අත්පත් කරගෙන ඇත. දනට ලෝකයේ පවතින සෙසු වරායන් අභිබවා මෙම වරාය අතිදුර්බල බහලු පර්යන්තයන් වෙත පරිවර්තනයවීම දකගත හැකි සුවිශේෂි ලක්‍ෂණයක් වේ. භාණ්ඩ පැටවීම හා ගොඩබෑම සඳහා ඉතාම සාර්ථක මෙවලම් වත්මන භාවිතා කරමින් පැවතියි. දනට මෙම මොක්පෝ වරාය පරිශ්‍රය තුළ කලාපයන් 02 ක් දකගත හැකිවේ. එනම්, එය මොක්පෝ වරාය හා දෙවෙනි මොක්පෝ නව වරාය ලෙසට වර්ගිකරණය කළ හැකිය. විවිධ කාර්ය අරමුණු සහිතව කේන්ද්‍රගතවී ඇති මෙම අංග 02 හි මොක්පෝ වරාය කොරියානු බිලියන 122.3 ක ආදායමක් ලබන අතර දෙවෙනි මොක්පෝ නව වරාය බිලියන 30.1 ක ආදායමක් ලබයි.

### විශේෂ ගුණාංග

1. වරාය පරිශ්‍රය තුළ හොඳම වෙළඳ කලාප දකගත හැකිවේ.
2. ස්වභාවික ජලතටාකය 15m ක ගැඹුරකින් යුතුවීම
3. නිරිතදිග කොරියානු කාර්මික ශාලාවෙත විශාල ලෙස භාණ්ඩ ආනයනය හා අපනයනය සිදුකරනු ලබයි.
4. සේවා සපයන ආයතන වෙත ඉමහත් සේවයක් සිදුකරනු ලබයි.

### අතිවිශාල කාර්මික ආයතන

1. ''ඩීබුල්'' (Deebul) ජාතික කාර්මික සංකීර්ණය
2. ''මොක්පෝ සප්ජින්'' (Mokpo Sapjin) කාර්මික සංකීර්ණය
3. ''ග්වාන්ජු හනාම්'' (Gawanju Hanaam) කාර්මික සංකීර්ණය
4. '' ග්වාන්ජු විද්‍යා'' (Gawanju widya) කාර්මික සංකීර්ණය
5. ''නජු මියෝන්යොං'' (Naju Miyonyo) කාර්මික සංකීර්ණය

### ප්‍රවාහනය සඳහා වරායට උදව් කරන ජාලයන්

1. ''මොක්පෝ'' (Mokpo) නව වරාය සඳහා ඇතුලුවන මාර්ගය
2. ''මොක්පෝ'' (Mokpo) පාලම ගොඩනැගීමේ ව්‍යාපෘතිය. (උතුරු වරාය සිය මොක්පෝ නව වරාය දක්වා)
3. අධිවේගී මාර්ග, ගුවන් මාර්ග හා දුම්රිය මාර්ග යහපත් මට්ටමක පවතියි.

### අනාගත අභියෝග

1. අන්තර්ජාතික ගුවන්තොටුපල හා අධිවේගී මාර්ග ඉදිකිරීම.
2. ''හවාවන්'' (Hawawan) සංචාරක කලාපය.
3. පවුල කේන්ද්‍රගත වූ විනෝදාත්මක විදේශිය වෙළඳාම් ව්‍යාප්ත කිරීම.

### සංවර්ධන ව්‍යාපෘතින්

| | | |
|---|---|---|
| 1. | බහලු බෙදාහැරීම | - 154,200 $m^2$ |
| 2. | ව්‍යාපාරික වෙළඳාම | - 64,490 $m^2$ |
| 3. | පොදු පාසල් | - 11,291 $m^2$ |
| 4. | ක්‍රීඩා/සංස්කෘතිය | - 55,560 $m^2$ |
| 5. | මාර්ග | - 99,109 $m^2$ |

# නව මොක්පෝ වරාය

සටහන -ගයත්‍රී විතාන

## දකුණු කොරියාව



International Network of Affiliated Ports

# INAP-2017


Port of Mokpo


Port of Colombo


Port of  Davavo


Port of  Kochi


Port of

අන්තර් ජාතික අනුබද්ධිත වරාය ජාලයේ 19 වන සමුළුව 2017.11.07 සහ 08 යන දිනයන්හි දි කොළඹ කිංස්ග්බරි හෝටලයේ දී පැවැත් විණි. වරාය හා නාවික අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, බංග්ලාදේශය, චීනය, ඉන්දුනීසියාව, ජපානය, දකුණු අප්‍රිකාව, දකුණු කොරියාව, පිලිපීනය සහ ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 8 ක සහභාගීත්වයෙන් දෙදිනක් පුරා මෙම අන්තර් ජාතික සමුද්‍රීය සමුළුව පැවැත් විණි.

**INAP** ඇරඹුම

1998 වසරේ ජපානයේ කොචි වරායේ දී ගන්නා ලද තීරණයක් ඇසුරෙන් මෙම අන්තර් ජාතික අනුබද්ධිත වරාය ජාලයේ ඇරඹුම සිදුවිය. එහි සමාරම්භය 1998 වර්ෂයේ නොවැම්බර් මස 17 සිට 19 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සත්කාරකත්වයෙන් පැවැත් විණ.

කොළඹ වරාය ඇතුළු වරායන් 6ක දායකත්වයෙන් පැවති මෙම සම්මේලනය ගෝලීය සාමය මගින් සොයුරී වරායයන් තේමාව ඔස්සේ පැවැත්විණි. එහි සමාරම්භක අවස්ථාවේ සමුළුව ඇමතූ කොචි වාරයේ ප්‍රධානී හෂිමිටෝ මහතාගේ යෝජනාවක් අනුව කලාපය තුළ සාමාජික වරායයන්ගෙන් සමන්විත ජාලයක් පදනම් කොට ගෙන සොයුරී වරායයන් අතර (Sister Ports) සහ සම්බන්ධතාව පවත්වා ගැනීමට තීරණය කරන ලදි.

ඒ සඳහා සමුද්‍රීය ප්‍රවාහන හා වරාය කටයුතු පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම සහ බෙදා ගැනීම පහසු කිරීම උදෙසා අවස්ථාව සලසා දීම, අන්‍යෝන්‍ය අදහස් හුවමාරු කිරීම් ප්‍රවර්ධනය සහ ගෝලීය වරාය පද්ධති
ජාලයන් නිර්මාණය කිරීම අරමුණු කරගත් වැදගත් ක්‍රියාමර්ග අධ්‍යයනය සහ සාකච්ඡා කිරීම, කලාපය තුළ සාමාජික වරායයන්ගෙන් සමන්විත ජාලයක් පදනම් කොටගෙන සමුද්‍රික ප්‍රවාහනය පිළිබඳ ජගත් පරිමාණ වරාය ජාලයක් නිර්මාණය කිරීම පිළිබඳ අවධානයට ලක්විය.

කොළඹ වරාය (Port of Colombo), කොචි වරාය (Port of Kochi), කින්ඩාවෝ වරාය (Port of  Qingdao), සුබික් බේ වරාය (Port of Subic Bay), ටැංජුන් පෙරක් වරාය (Port of tanjung perak) සමාරම්භක අන්තර් ජාතික අනුබද්ධිත වරාය ජාලයට එක්වූ වරායයන් ය.

පිලිපීනයේ සිබු (Port of Cebu ) වරාය 2000 වර්ෂයේ මෙහි සාමාජිකත්වය හිමිකර ගන්නා ලදී. මොක්පෝ නව වරාය 2007 වර්ෂයේ ද, කොරියාවේ ඩැන්ජින් 2014 වර්ෂයේ ද, පිලිපීනයේ දවාවෝ වරාය

## අන්තර් ජාතික අනුබද්ධිත වරාය ජාලයේ අරමුණු

සාමාජිකයන් අතර මිත්‍රශිලී හා එකමුතු බවේ මූලධර්ම තහවුරු කර ගනිමින්, පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ විශේෂ කාර්ය භාරයක් ඉටුකිරීම තුළින් සාමකාමී හා පරිසර හිතකාමී යහපත් අවකාශයක් සහ එකමුතු ලොවක් ගොඩනැගීම අරමුණ වේ. මෙම දැක්ම යථාර්තයක් බවට පත් කර ගැනීමේ දී,

- අන්තර් ජාතික අනුබද්ධිත වරාය ජාලයේ සහ සම්බන්ධතා ක්‍රමවත්ව පවත්වා ගෙන යාම.
- සාමාජික වරායයන්ගේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ තොරතුරු හුවමාරුව තුළින් අනුබද්ධිත වරාය ජාලයේ සම්බන්ධතා වඩාත් අර්ථාන්විතව වරාය සංවර්ධනයට, ප්‍රවර්ධනයට හා කළමනාකරණයට යොදා ගැනීම.
- සාමාජික වරායන්ට අයත් විවිධ ජාතින්ගේ මිත්‍ර සම්බන්ධතා හඳුන්වා දීම සහ එකී ජාතීන්ගේ ආර්ථික හා සංස්කෘතික සහ සම්බන්ධතා ශක්තිමත් කර ගැනීම මෙහිලා ප්‍රධාන වේ.









# අභිමානය




Subic Bay



Port of Qingdao



Port of Tanjung Perak



Port of Cebu



(Port of Davavo) 2016 වර්ෂයේ ද අන්තර් ජාතික අනුබද්ධිත වරාය ජාලයේ (INAP) සාමාජිකත්වය හිමිකර ගන්නා ලදි.

අන්තර් ජාතික වරාය ජාලයේ ඇරඹුම පිළිබඳ සිහිපත් කිරීමේ දී එහි පුරෝගාමීත්වය ඉසිලූ ඒ උදෙසා දැඩි පරිශ්‍රමයක් දැරූ ප්‍රාරම්භක පියවරුන් ලෙස ශ්‍රී ලංකාවේ එවකට වරාය සංවර්ධන, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයාව සිටි එම්.එච්.එම්. අෂ්රොෆ් මැතිතුමා සහ ජපානයේ කොචි වරායේ ප්‍රධානී දයිජිරෝ හෂිමිතෝ මැතිතුමා සැළකේ.

අන්තර් ජාතික අනුබද්ධිත වරාය ජාලයේ වත්මන් ලේකම් කාර්යාලය ජපානයේ කොචි හි පිහිටා ඇත. රටවල් 6 කට අයත් වරායන් 9ක් ජාලගතව සාමාජිකත්වය උසුලයි. එනම්, පිලිපීනයේ සිබු වරාය, දවාවෝ වරාය, සුබික් බේ වරාය, ශ්‍රී ලාංකේය කොළඹ වරාය, දකුණු කොරියාවේ ඩැන්ජින් වරාය සහ නව මොක්පෝ වරාය, ජපානයේ කොචි වරාය, චීනයේ කින්ඩාවෝ, ඉන්දුනීසියාවේ ටැංජුං පෙරක් යන වරායයන් ය.

අන්තර් ජාතික අනුබද්ධිත වරාය ජාලයේ 19 වන සමුළුව (The 19th INAP)

අන්තර් ජාතික අනුබද්ධිත වරාය ජාලයේ සමුළුව සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය පූර්ණ සත්කාරකත්වය ලබා දෙන තෙවන අවස්ථාව මෙය වේ. මෙහි පළමු සම්මේලනය 1998 නොවැම්බර් 17 - 19 දක්වා ද, 13 වන සම්මේලනය 2011.08.24 - 26 දක්වා ද, කොළඹ දී පැවැත්වීම සුවිශේෂිත ය. එමෙන්ම, 2017.11.08-09 යන දිනයන් හිදී පැවැත් වූ 19 වන සමුළුවේ දී ඉදිරි වර්ෂය සඳහා අන්තර් ජාතික අනුබද්ධිත වරාය ජාලයේ සභාපතිවරයා ලෙස ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා පත් විය.

වරාය හා නාවික නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මහතා ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී වන මෙම සමුළුව ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණ සමුළු ආදිය පැවැත්වීමෙහිලා සත්කාරක රටක් ලෙස ශ්‍රී ලංකාව ලබා ඇති අද්විතීය ස්ථානය ඔසවා තැබීමට වෙසෙසින් ඉවහල්වනු ඇත.

**සටහන**
**උපුල් ගුරුගේ**
















# ගිනස් පොතට ගිය අපේ කාලයේ යෝධයා



අසීමිත කාය ශක්තියත් වීරකම් කළ යෝධයන් ගැනත් ඉතිහාසයේ සඳහන් කතා ගැන අපි කොතෙකුත් අසා ඇත්තෙමු. අද දවසේ අපි කතා කරන්න යන්නේ නූතන කාලයේ එවන් සුරුවිරුකමින් ඉදිරියට පැමිණ ලොවක් මවිත කළ වරායේ සේවක මහතෙකු පිළිබඳවයි. ඔහු ජනක කංචන මුදන්නායක. හඟුරන්කෙත යෝධයා නමින් ප්‍රචලිතව ලෝක වාර්තා 7 ක් තැබූ ගාමිණී වසන්ත ගුරුයාගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර වන ජනක රූපවාහිනී නාලිකා කිහිපයකම තම දක්‍ෂතා පෙන්වා ජනප්‍රිය ධාරාවේ වීරයෙකු ලෙස ද මේ වන විට ජනාදරයට පත්ව ඇත. මේ ඔහුගේ වික්‍රමයන් පිළිබඳ කළ සංලාපයකි.

**ඔබ 2017 වසර අවසන් කළේ තවත් ලෝක වාර්තාවකට හිමිකම් කියමින්..?**

ඔව්, පසුගිය දෙසැම්බර් මස 29 වැනිදා පෙරවරු 10.00 ට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ සමුද්‍රීය විද්‍යායතනයේ දී මම මගේ හතරවැනි ලෝක වාර්තාව පිහිටෙව්වා. මම 50 Kg බර පිටි මුට්ට 17 ක් විනාඩි 28 යි තත්පර 53 දශම 5.7 ක් තුළ මීටර් 30 ක් දුර දත්වලින් රැගෙන ගිහින් තමයි මේ වාර්තාව පිහිටෙව්වේ. එය නව ලෝක වාර්තාවක් විදියටයි ගිනස් පොතට ඇතුළු වන්නේ.

**ඔබ මීට පෙර පිහිටුවපු වාර්තා ගැනත් කතා කරමු...**

මම මුලින්ම ලෝක වාර්තාවක් පිහිටෙව්වේ වයස 10 දී ටොන් 9.30 ක් බර කෝච්චියක් පැය 1යි 1/4 ක් තුළ ඇඟිලිවලින් තල්ලු කරලයි එම වාර්තාව තැබුවේ. ජපන් ජාතික කදෝ ජොයිංමාරි මීට පෙර තැබූ වාර්තාවයි මම එදා බිඳ දැමුවේ. ඒ 1998 දී 2012 දී මම දෙවැනි වාර්තාව තැබුවේ එතැනදී ටොන් 1 1/2 ක් බර L 300 වර්ගයේ වෑන් රථ 32 ක දකුණු අතේ ඇඟලි උඩින් ගමන් කෙරෙව්වා. විනාඩියක් තුළ මිලි මීටර් 12 ක් ඝණකම් කම්බි 18 ක් දත්වලින් නවා 2016 දී රුසියානු ජාතික ඇලෙක්සැන්ඩර් මොරොම්පති තැබූ වාර්තාව බිඳ දමන්නට මට හැකිවුණා. ඒ මගේ තෙවැනි වාර්තාව

**ටොම් ඔවන් තැබූ වාර්තාව බිඳ දැමීමටත් ඔබ උත්සාහ කළා ද..?**

ඔව්, ඒ 2016 දී පපුවේ ලෑල්ලක් තියලා ඒ මතින් මෝටර් රථ 9 ක් යවන එක තමයි ඒ වාර්තාව. ඒත් 4 වැනි වාහනය පපුව උඩදී නතර වුණා. ඒක මගේ වරදක් නොවෙයි රියදුරෙක්ගේ වරදක් හා කාර්මික දෝෂයක්. එදා මම එය නැවත කරන්න හැදුවත් වෛද්‍යවරු මට එයට ඉඩ දුන්නේ නෑ. හැබැයි ඉදිරියේ දී මම ඒ වාර්තාව කොහොමහරි තබනවා.

**ඔබ ඉදිරියේදීත් ලෝක වාර්තා තියන්න සූදානමින් ද ඉන්නේ..?**

ඔව්, තවත් වාර්තා 17 ක් සැළසුම් කරගෙන ඉන්නවා.

**වරාය අධිකාරියෙන් මේ සඳහා ලබා දෙන ශක්තිය ගැන කතා කළොත්**

වරාය හා නාවික අමාත්‍යතුමා, නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු සියලු කාර්ය මණ්ඩල, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගරු සභාපති තුමා, උප සභාපතිතුමා ප්‍රමුඛ කළමණාකාරිත්වයත් සියළුම විධායක නිලධාරී මහත්ම මහත්මීන් සහෝදර සේවක මහත්ම මහත්මීන් මගේ ශක්තියට සිටිනවා. ඔවුන්ගේ සුභ පැතුම් මට හැමදාම තියෙනවා.

**ඔබේ ඊළඟ ඉලක්කය..?**

ඔව් මේ දිනවල youth with talent අවසන් මහා තරගයේ දී සුපිරි තරගයක් ලබා දීමට පෙර පුහුණු කටයුතු සිදු කරනවා.

අපිත් එක්ක සිටින අපේ කාලයේ යෝධයාට අපේ සුභාශිංසන එකතු කරමු. හදවතින්ම වරායේ අපි එක්ව.

**සටහන -ගුරු**

## විශ්‍රාමික විධායක නිලධාරි සංගමයේ මහත්ම මහත්මීන් වරාය අධිකාරියේ සභාපතිතුමා හමුවෙති



දශක ගණනාවක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උන්නතිය උදෙසා ස්වකීය දායකත්වය ලබාදුන් විශ්‍රාමික විධායක නිලධාරි මහත්ම මහත්මීන්ගෙන් සැදුම්ලත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විශ්‍රාමික නිලධාරීන්ගේ සංගමයේ මහත්ම මහත්මීන් හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා අතර විශේෂ හමුවීමක් පසුගිය දා සභාපති කාර්යාලයේ දී පැවැත්විනි.

මෙහිදී වරාය අධිකාරියේ ඉදිරි සංවර්ධන කටයුතු මෙන්ම එහි හෙට දවස පිළිබඳව අදහස් හුවමාරු වූ අතර, පසුගිය කාලය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලැබූ ප්‍රගතිය පිළිබඳ විශ්‍රාමික නිලධාරීන්ගේ සංගමයේ නිලධාරී මහත්ම මහත්මීන් ස්වකීය ප්‍රශංසාව සභාපතිතුමන් වෙත පළ කරන ලදී. තවද, ඔවුන්ගේ සේවා අත්දැකීම් හා පලපුරුද්ද සමගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉදිරි සංවර්ධනය උදෙසා සිය අදහස් හා යෝජනා ද ඉදිරිපත් කරන ලදී.

විශ්‍රාමික මාණ්ඩලික නිලධාරීන්ගේ සංගමය 1995 වසරේ දී සාමාජිකයින් 25කින් ආරම්භ කරන ලද අතර, අද එහි සාමාජිකත්වය 252 ඉක්මවයි.

## එක්ව නැගිටිමු - අටුකොටු පුරවමු





ශ්‍රී ලංකා වරාය අධිකාරිය වැ.බ. සභාපති පී.ජී. දසනායක මහතාගේ ප්‍රධානත්වයෙන් හා කළමනාකාර අධ්‍යක්‍ෂ එච්.ඩී.ඒ.එස්. ප්‍රේමචන්ද්‍ර මහතාගේ සහභාගීත්වයෙන් ආයතනික වැඩසටහන වරාය සම්බුද්ධත්ව ජයන්ති චෛත්‍ය පරිශ්‍රයේදී පැවැත් විණි.

එහිදී මෙම ජාතික වැඩ පිළිවෙල පිළිබඳව අදහස් දක්වමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැ.බ. සභාපති පී.ජී. දසනායක මහතා ප්‍රකාශ කර සිටියේ, ලෝකය තුළ නොයෙකුත් ස්වභාවික විපත් සහ නොයෙකුත් හේතූන් මත ආහාර සුරක්‍ෂිතතාව පිළිබඳව අදහස් හුවමාරු වන සමයක රජය විසින් ආහාර නිෂ්පාදන සංග්‍රාමයක් ඇරඹීම අනාගත ස්වයංපෝෂිත ශ්‍රී ලංකාවක් සඳහා තබන ඉතා වටිනා පියවරක් බව හෙතෙම පැවසීය.

විශේෂයෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සේවක මහත්ම මහත්මීන් මේ සඳහා උපරිම දායකත්වයක් දක්විය හැකි බව ද ඔහු විශ්වාසය පළ කරන ලදී.

වැඩසටහනට සමගාමීව බීජ හා පැළ බෙදාදීමේ වැඩසටහනක් ද පැවැත් විණි. ඒ අනුව වම්බටු හා මාළුමිරිස් බීජද පේර, කටු ආතා, දෙඩම් පැළ වර්ග ද සේවක මහත්ම මහත්මීන් හා කොට්ඨාශ අතර බෙදා දෙන ලදී.

මාපිටිගම මංජුලා මහත්මියට

## ආරක්‍ෂක කොට්ඨාශයෙන් හිසට සෙවණක්





දුමිඳු හඳගම

හිසට සෙවණක අගය දන්නේ හිසට සෙවනක් නොමැතිව දුක්ඛ දෝමනස්සයන්ට මුහුණ දෙන්නා වූ මිනිසුන් ය. මිනිසත් බව දන හැඳින එකිනෙකාට උපකාර කිරීම පරම චේතනා පෙරදැරිව මල්වාන, මාපිටිගම ප්‍රදේශයේ වැන්දඹු පස්දරු මවකට හිසට සෙවන සලසා දීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආරක්‍ෂක කොට්ඨාශය පසුගියදා කටයුතු කරන ලදී. මල්වාන, උඩමාපිටිගම, දෙහිගහහේන, සඳගිරි රබර් කර්මාන්ත ආයතනයේ රසික ලක්මාල් ඉඹුලාන මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආරක්‍ෂක අංශයේ නිලධාරීන් එක්ව අංග සම්පූර්ණ නිවසක් තනවා පසුගිය දා මංජුලා අරඹෙවත්ත මහත්මියට උත්සවාකාරයෙන් භාරදෙන ලදී.

එයට සමගාමීව මංජුලා අරඹෙරත්න මහත්මියගේ දරුවන් පස්දෙනා වෙත මසකට රු.10000/- බැගින් ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා වන ශිෂ්‍යයත්වයක් ''ආවේ ඉන්ටර්නැෂනල්'' ආයතනයේ ප්‍රියන්ත මහත්මා විසින් ප්‍රදානය කරන ලදී.

මෙම අවස්ථාව සඳහා අධ්‍යක්‍ෂ (සේවා සැපයුම්) උපාලි සොයිසා මහතා, ප්‍රධාන කළමණාකරු (සුභසාධන) නිමල් ජයතිස්ස මහතා, හිටපු ආරක්‍ෂක කළමණාකරු නිශ්ශංක විජේසිංහ මයා, ටී.පී.ඩී.ද සිල්වා මයා, කේ.ජී.උපාලි මයා ඇතුළු විශාල පිරිසක් සහභාගී වන ලදී.

මෙම උදාර සත්කාරය හිටපු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ආරක්‍ෂක) ටී.එච්.ඩී.පී. ද සිල්වා මහතාගේ සංකල්පයක් හා සාමුහික ප්‍රයත්නයක් ලෙසින් මල්ඵල ගැන්වීමකි.

අන්තරායකර නැව් භාණ්ඩ ආරක්ෂාකාරීව ප්‍රවාහණය පිළිබඳ පුහුණු පාඨමාලාවක්

## මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යයතනයේ දී







අති විනාශකාරීඅවි ආයුධ හා එවන් අවි නිපදවීමට යොදාගත හැකි ද්‍රව්‍ය වරාය පරිශ්‍රයන් තුලින් සංසරණයවීම වැලැක්වීම සහ අන්තරායකර නැව් භාණ්ඩ ආරක්ෂාකාරීව ප්‍රවාහණය කිරීමේ ජාත්‍යන්තර පිළිවෙත් සම්බන්දයෙන්, ශ්‍රී ලංකා - යුද, ගුවන් සහ නාවික හමුදා පොලිස් නිලධාරීන් සඳහා පුහුණු පඨමාලා පැවැත්වීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ - විශේෂ විමර්ශන ඒකකය මගින් පසුගියදා ප්‍රථම වරට ආරම්භ කරන ලදී.

වරාය අධිකාරියේ සභාපති පරාක්‍රම දිසානායක මහතා, අධ්‍යක්ෂ (ආරක්ෂක) මේජර් ජෙනරාල් ගාමිණී හෙට්ටිආරච්චි මහතා සහ හාබර් මාස්ටර් කපිතාන් අතුල හේවාවිතාරණ යන මහත්වරුන්ගේ මගපෙන්වීම යටතේ කපිතාන් හර්ෂ වීරසූරිය මහතා විසින් පාඨමාලා පැවැත්වීම සිදුකරනු ලැබූ අතර, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් පී.එස්.එම්. චාර්ල්ස් මහත්මියගේ සහ ''මෙගාපෝර්ට්'' ආවේක්ෂණ ඒකකය භාර නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ ආර්.ඒ.ජේ. බුද්ධදාස මහතාගේ මගපෙන්වීම යටතේ, සහකාර රේගු අධිකාරී ඉඳුනිල් උමේෂ් මහතා විසින්ද දේශණ පැවැත්වීම සිදුකරන ලදී.

මෙම සමාරම්භක පාඨමාලාව ශ්‍රී ලංකා යුද හමුදා පොලිස් පුහුණු පාසල සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආරක්ෂක පුහුණු පාසල කේන්ද්‍ර කරගනිමින් මෙන්ම, කොළඹ වරාය පරිශ්‍රය තුළදී ප්‍රායෝගික අධ්‍යයන අවස්ථාවන් සලසමින් පවත්වනු ලැබ ඇති අතර, සන්නද්ධ හමුදා පොලිස් නිලධාරීන්, නිලධාරිණියන් 35 දෙනෙකු සහ සෙසු නිලධාරීන් 276 දෙනෙකු හට සාර්ථකව පාඨමාලාව හැදෑරීමේ අවස්තාව හිමිව ඇත. එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා රාජකාරි සඳහා එක්වන, ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා පොලිස් නිලධාරීන් හට සහ විශේෂ විමර්ශන රාජකාරීන් සඳහා යොදවනු ලබන සන්නද්ධ හමුදා නිලධාරීන් හට මින් ඉදිරියේදී ද මෙම පාඨමාලාව හැදෑරීමේ අවස්ථාව හිමි වනු ඇත.

## Mv Milan Maersk කොළඹ වරායට

ලෝකයේ ලොකුම බහලු ප්‍රවාහන නෞකාවක් පසුගිය දා කොළඹ වරායට සේන්දු විය. එය, මෙවන් නෞකාවක ප්‍රථම දකුණු ආසියානු ආගමනයයි. කොළඹ වරායේ CICT පර්යන්තයට සේන්දු වූ Mv Milan Maersk (මිලාන් මර්ස්ක්) නෞකාවේ ප්‍රථම ගමන සැමරීම හා මෙවන් නෞකාවක් දකුණු ආසියානු කලාපයට ප්‍රථම පැමිණීම සැමරීම සඳහා වන සමරු ඵලක හුවමාරුව CICT පර්යන්තයේ Mv Milan Maersk නෞකාව මතදී සිදුවිය. සමරු ඵලක හුවමාරුව සඳහා නෞකාවේ කපිතාන් JogVan Peterson (ජෝග් වැන් පීටර්සන්) මහතා සමග ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්තය (CICT), Maersk නෞකා ජාල සමාගම ද එක්වීය.



ලෝකයේ සුවිශාලතම බහළු නෞකාවලින් එකක් වන, මෙම Mv Milan Maersk නෞකාව මෙම වර්ෂයේ නිෂ්පාදනය කර ඇත. එය බහළු 20568 TEU ක ධාරිතාවයකින් යුක්ත වන අතර, ටොන් 212400 ක් ප්‍රවාහනය කළ හැකි ය. සම්පූර්ණ දිග මීටර් 399 කි. පළල මීටර් 58 කි. නෞකාව ඩෙන්මාර්ක් ධජය යටතේ යාත්‍රා කෙරේ.

මෙම අවස්ථාවට සහභාගී වූ ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු තානාපති අතිගරු අතුල් කේෂාප් මහතා ප්‍රකාශ කළේ ''ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ නාවික මධ්‍යස්ථානයක් ලෙස ඉතා උසස් කාර්‍යක්‍ෂම සේවාවක් ලබාදීම අගය කරන බවත්, එහි ප්‍රවර්ධනය සඳහා වන ඕනෑම කටයුත්තකට ඒ සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට තම රට එක් වන බවත් පැවසීය.''

ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා - සභාපති - ශ්‍රී ලංකා වරාය අධිකාරිය, මේ අවස්ථාවේ සිය උණුසුම් සුභ පැතුම් Maersk සමාගම වෙත එක් කරමින් ප්‍රකාශ කළේ ''Maersk සමාගම විසින් කොළඹ වරාය කෙරෙහි තබා ඇති විශ්වාසයට ස්තුතිවන්ත වන බවයි.'' ''Maersk සමාගම කොළඹ වරායේ බහළු මෙහෙයුම් ධාරිතාව වර්ධනය කිරීම සඳහා දක්වන දායකත්වය ඉදිරියේ දී ද අඛණ්ඩව ලබා දෙනු ඇති බවට'' ද විශ්වාසය පළ කළේ ය.



# "වේදිකාවෙන් ලබන පන්නරය ජීවිතයටත් ආලෝකයක්"

- සන්ධ්‍යා විතාන -

වේදිකාවට අවැසි ප්‍රසන්න පෞරුෂයත් රූ ස්වභාවත් මිටිකර ගත් ඈ වේදිකාව තුළ පෑ ප්‍රතිභාන්විත රංග ස්වභාවය විස්මය ජනක විය. රංගනය මතු නොව රචනය අධ්‍යක්ෂණය ඇතුළු අනුසාංගික කාර්යන්හිදි ඈ දක්වූ කුසලතාවය වරායේ ඔබ සැමට අමතක නොවනු ඇත. සන්ධ්‍යා රමණී විතාන නම් වූ ඇය සමග තීර්ථ සංලාපයකට මුල පිරුවා.

**කොහොමද ඔබ කලාවට අත්පොත් තබන්නේ,**

අපේ පවුල සමග නාට්‍ය කලාව නිරන්තරයෙන් ම රැඳී පැවතුණා. මගේ පියා කලාවට බොහොම ලැදි කෙනෙක්. ඔහු විදුහල්පතිවරයෙක් ලෙස කටයුතු කළා. ඒ වගේම සාහිත්‍යයට බොහොම ලැදියි. ඒ ආභාසය පුංචි සන්දියේම මට ලැබුණා කිව්වොත් නිවැරදියි. ඊට පස්සේ පාසල් වේදිකාව මගේ නිර්මාණ ජීවිතය ආලෝකමත් කළා. මම පාසල් ගියේ මතුගම ශාන්තමේරි විද්‍යාලයට. එහි තූර්‍ය වාදක කණ්ඩායමේ නායිකාව හැටියටත් මං ඒ දවස්වල කටයුතු කළා. පාසලේ තිබුණු හැම කලා කටයුත්තකදීම මං බොහෝම කැපවීමෙන් වැඩ කළා. පසුකාලීනව මගේ පාසලේම දරු දැරියන් යොදා ගනිමින් "යාළුයි අපි යාළුයි" වේදිකා නිර්මාණය රාජ්‍ය ළමා නාට්‍ය උළෙල සඳහා ඉදිරිපත් කළා.

**මොනවද ඊට අමතරව ඔබ නිර්මාණය කල වේදිකා නිර්මාණ...**

"තාත්තේ මගේ තාත්තේ", "ජාතික සමගිය" වේදිකා නිර්මාණ ඒ අතර ප්‍රධාන වෙනවා.



**ඔබ වරායට පිවිසෙන්නේ 1986 අවුරුද්දේ...**

ඔව්, 1986 වසරේ දී වරායට සම්බන්ධ වීමට ලැබීම මගේ ජීවිතේ මා ලැබූ භාග්‍යක් හැටියට මං සලකනවා. එදා සිට අද දක්වා වරායේ විවිධ කලා කටයුතුවලට දායක වන්නට මං වාසනාවන්ත වුණා.

**මොනවද ඒ සොඳුරු මතකයන්...**

1998 වසරේ දී වරාය අධිකාරියේ "ජාතික සමගිය" සංස්කෘතික තරගාවලිය නමින් සංස්කෘතික උළෙලක් පැවැත්වූවා. ඒ සඳහා මම එවකට සේවය කළ ක්‍රියාකරවන කොට්ඨාශයේ බණ්ඩාරනායක පාලම ප්‍රමුඛ වරායේ සහෝදර සේවක කැල ඒකරාශී කරගෙන "ජාතික සමගිය" නමින් වේදිකා නාට්‍යයක් නිර්මානය කළා. ඒ නාට්‍යය එම උළෙලේ හොඳම නාට්‍ය, හොඳම අධ්‍යක්ෂනය, හොඳම නිළිය ඇතුළු සම්මාන රැසකින් පිදුම් ලැබුවා. ඒ විතරක් නොවෙයි මට රන් සම්මානයකුත් හිමිවුණා. ඒ දවස් මගේ කලා ජීවිතේ සොඳුරුතම දවස් විදියට සලකන්නට පුළුවන්.

**ඔබ මෑතකාලීනව රංගනයෙන් දායක වෙමින් නිෂ්පාදනය කල "උඹ දොස්තර වෙයන් පුතේ" නාට්‍ය නිර්මාණය ප්‍රේක්ෂකයන් ආදරයෙන් වැලඳ ගත්තා...**

ඔව්, එම නාට්‍ය ලෝක කාන්තා දිනය වෙනුවෙන් නිර්මාණය කිරීමට මා හට අවස්ථාව උදා වුණා, එහිදි පුරුෂාධිපත්‍යට යටත්ව දිවිගෙවන ග්‍රාමිය කාන්තා ආත්මයක සැඟවුණු දුක්ඛ දෝමනස්සයන් වේදිකාව මත ප්‍රතිනිර්මාණය කිරීමට මට අවශ්‍ය වුණා. මගේ උත්සාහය ඵල දැරුවා කියා ලැබුණු ප්‍රේක්ෂක ප්‍රතිචාරවලින් මට දැනුණා.

**ඔබේ ඉදිරි කලා කටයුතු පිළිබඳව කතා කළොත්...**

හෙට දවසේ වේදිකාව නිර්මාණකරණයේ නවමු ප්‍රසාංගික අත්දැකීමක් ප්‍රේක්ෂකයාට ලබා දීමට අදහස් කරනවා. ඒ වගේම මං ලියපු කාව්‍ය සංග්‍රහය ඉදිරියේ දී එළි දැක්වීමටත් මං බලාපොරොත්තු වෙනවා. මං රචනා කළ ජීමියයි සුදාරයි, පවනි බබාගේ මල්වත්ත ළමා කෘති වල දෙවන මුද්‍රණ සිදු කිරීමටත් බලාපොරොත්තු වෙනවා.

සංලාප සටහන -ගුරු

# හරවත් ජීවිකාර්ථයක් මතුකොට දැක්වීම අභියෝගාත්මත කාරණයක්...

## කැලුම් දීපාල් රාමනායක




කෙටිකතා කරුවෙකු සතු සියුම් මනෝභාවයන් උකහාගැනීමේ අපූර්වත්වය හෙබි ඔහු ස්වකීය කළුදුල් කෙටිකතා සරණිය තුළින් හදට වගේම බුද්ධියටත් කතා කරනවා. කැලුම් දීපාල් රාමනායක නම් වූ යොවුන් නිර්මාණ කරුවා සමග තීර්ථ ඔබ වෙනුවෙන් සංලාපයේ යෙදුණා...

**ඔබ කෙටිකතාකරණයට පිවිසෙන්නේ..?**

මා කුඩා කළ සිටම ඇබ්බැහි වූ පුරුද්දක්. ළමා කතා, යොවුන් කතා, ආදියෙන් ආරම්භය ගෙන නවකතා කියවීමෙන් නවකතා ශානරයෙහි සොඳුරු ඉසව් වින්දනය කළා. පසු කාලිනව ගීද මෝපසාන්, ඇන්ටන් චෙකොප්, ගොගොල්, එඩ්ගා ඇලන්පෝ වැනි විශ්ව සාහිත්‍යයේ ප්‍රමුඛයන්ගේ කෙටිකතා පතපොත පරිශීලනය කරන්නට හැකිවෙනවා. ඒ වගේම සයිමන් නවගත්තේගම, ටෙනිසන් පෙරේරා, ජයතිලක කම්මැල්ලවීර වැනි සිංහල කෙටිකතා කලාවේ ප්‍රමුඛයන්ගේ පොතපත ද පරිශීලනය කරන්නට ලැබෙනව. ඒ පොතපත පරිශීලනයෙන් කෙටිකතා කලාව අරභයා මගේ සිතේ ජනිත වූ ආනන්ද ජනක හැඟීම මම අර කලින් සඳහන් කරපු මගේ සිතේ ගොඩනැගුණු සිතුවිලි කන්ද හා ගැටීමෙන් ඇති වූ කම්පනය කෙටිකතාකරණය වෙත මා යොමු වන්නට ප්‍රධාන ලෙස බලපාන්නට ඇතැයි මම විශ්වාස කරනවා.

**ජීවමය කෙටිකථාවක්, "වෙඩි උණ්ඩයක් පුපුරායාමක් " හා සමානයි, කියා කියමනක් තිබෙනවා. ඔබේ කෙටිකතාවල මෙකී ගුණය පිළිබඳව ඔබ සෑහිමකට පත් වෙනවාද..?**

ඔව් ඒ ඇයි ද කියනවානම් මම කෙටිකතා කලාවට පිවිසෙන්නේ බොහෝ පොතපත පරිශිලනයෙන් හා මූලික හැදෑරීමකින් පසුව. සැබවින්ම කෙටිකතා කලාවේ සැබෑ කලාත්මක ලක්ෂණ ආරක්ෂාකර ගනිමින් අප වෙසෙන සමාජ දේහයෙන් උකහාගත් අනුභූතින් සම පුද්ගල මානුශීය ගැටලු නිරූපණය කරමින් හරවත් ජීවිකාර්ථයක් මතුකොට දක්වීම අභියෝගාත්මත කාරණයක්. කතාරසය වගේම අර්ථාන්විතභාවය ආරක්ෂා කර ගනිමින් කතාව අවසානයේ පාඨක සිත් සතන් තුළ සංවේදනාත්මක වෙව්ලුම් කෑමක් ඇති වෙනවානම් මම හිතනවා එය ලේඛකයාගේ අභිප්‍රායන් සඵල වීමක් ලෙස. එය ඉතා සංයමයකින් හා ඉවසිලිවන්තව කළ යුතු කාර්යයක්, මම හිතනවා මගේ බොහෝ කෙටි කතාවල එකී ගුණය ආරක්ෂා වී ඇති බව.

**වරාය සේවය අතරතුර ඔබේ කලාවට හිමිවන තැන..?**

සැබවින්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සාඩම්බර සේවකයෙකු වශයෙන් මගේ රැකියාව තුළ මම තෘප්තිමත්. එසේ මා ලැබූ මානසික තෘප්තිමත්භාවය නිර්මාණකරණයට එළඹෙන්නට විශාල පිටුබලයක් සැපයුවා. කෙසේ වෙතත් අද පවතින ආර්ථික ක්‍රමය තුළ ඉපයීම් පත යැපෙන කුටුම්භ රක්ෂණයේ දී අපි හැමෝම අවිවේකි වෙලා. පැවැත්ම, යුතුකම් හා වගකීම් සපුරාගන්නට අපි හැමෝටම වගේ මටත් අතිකාල සේවය වෙත යොමුවන්නට සිදුවෙලා තිබෙනවා. ඒ නිසා අවිවේකි බව නිර්මාණ කටයුතුවලට බාධාවක්. රැකියාව අතරතුර වුවත් මට ලැබෙන සුලු විවේකය පොතපත පරිශීලනයට හා නිර්මාණ කරනයට යොදාගන්නට මම උත්සාහ කරනවා. කෙසේ වෙතත් නිර්මානකරණය හා මගේ රැකියාව සමබරව පවත්වා ගැනීම මගේ අභිප්‍රායයි.



**ඔබගේ ඉදිරි නිර්මාණ කටයුතු..?**

මගේ ඊළඟ පියවර නවකතාවක්, එය "වැව් බැඳි රාජ්‍යයේ වැවක් හා ගණ වනාන්තරයක් මායිම්ව ප්‍රතිනිර්මාණය වන පුරාණ ගමක් මූලික කරගෙන ලියවෙන්නක්" නොයෙක් නොයෙක් ප්‍රදේශ වලින් පැමිණ තම පැවැත්ම උදෙසා සාමුහික ජීවන අරගලයක යෙදෙන මිනිසුන් හා ඔවුන් මුහුණදෙන ගැටළු ගැන සාකච්ඡා කෙරෙන කතාවක් මම හිතනවා තව මාස කිහිපයකින් එය එළිදකින්නට හැකි වේවි කියා.

# වරායේ නිල නිවැසියන් සතු කාර්ය භාරය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ සේවා කාලය, කොළඹ වරායේ සිට කි.මී.30ක් ඇතුළත පිහිටි නිවසක් නොතිබීම, සතුටුදායක කාර්ය සාධන ඇගැයීම හා සේවයේ අත්‍යාවශ්‍යතාවය මත පදනම්ව ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් නිල නිවාස සඳහා අයදුම් කිරීමට සේවක ඔබට හැකි බැව් ඔබ කවුරුත් හොඳින් දන්නා කරුණකි. එසේ වුවද නිල නිවාස නඩත්තු කිරීම හා ඒවායේ දේපල වත්කම් ආරක්ෂා කිරීම සම්බන්ධව කරුණු කාරණා පිළිබඳ දැන ගැනීමට අපි නිවාස අංශයට පිවිසියෙමු.

හිල් හවුස්, එලි හවුස්, ගල් පල්ලිය, පරාක්‍රම නිවාස, විද්‍යාල භූමිය, බුලර්ස් පටුමග, වැල්ලවත්ත චාලිමන්, විපුලසේන මාවත, අබ්දුල් හමීඩ් මාවත, පෙරහැර මාවත, සල්ගාදු නිවාස, ඩීප් ඩීන්, වොස් ලේන්, ශාන්ත ජේම්ස්, බ්ලූමැන්ඩල්, මහර ආදී තදාසන්න කොලොම්පුරේ ඉසව් ගණනාවක විසිරී තිබෙන වරාය නිල නිවාස 630 කට අධික ප්‍රමාණයක් ද, නුවරඑළිය, කතරගම, ගාල්ල සංචාරක නිවාස හා සුභසාධක නිවාස නඩත්තු කිරීම හා එකී දේපල ආරක්ෂා කිරීම නිවාස අංශය මගින් සිදුවේ.

වරාය නිල නිවාස ඒවායේ විවිධත්වය මත ශ්‍රේණි හතකට වර්ගීකරණයකට ලක්කර ඇත. එනම්,

**I වන ශ්‍රේණිය**
සභාපති/උපසභාපති/කළමණාකාර අධ්‍යක්ෂ

**II වන ශ්‍රේණිය**
අධ්‍යක්ෂවරුන් (**JLM 2**) හා කොට්ඨාශ ප්‍රධානීන් (**SLM 1**)

**III වන ශ්‍රේණිය**
අංශ ප්‍රධානීන් (**SLM 2**) හා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (**SLM 3**)

**IV වන ශ්‍රේණිය**
කළමණාකරුවන් (**MLM 1**) සහකාර කළමණාකරු (**MLM**) හා කණිෂ්ඨ කළමණාකාරිත්වය (**JLM**)

**V වන ශ්‍රේණිය**
අධිශ්‍රේණි (**SG**) තාක්ෂණික ශ්‍රේණි (**T**) තාක්ෂණික නොවන ශ්‍රේණි (**NT**)

**VI වන ශ්‍රේණිය**
පුහුණු තාක්ෂණික ශ්‍රේණි (**ST**) පුහුණු තාක්ෂණික නොවන ශ්‍රේණි (**SNT**)

**VII වන ශ්‍රේණිය**
අර්ධ පුහුණු ශ්‍රේණි (**SS**) නුපුහුණු ශ්‍රේණි (**NS**) වශයෙනි.

මෙලෙස වර්ගීකරණයට ලක්වූ නිවාස හිමි සේවක මහත්ම මහත්මීන් වෙත එම නිවස්නයන්හි පදිංචි කාලය තුළ සියළුම නඩත්තු කටයුතු සිදු කිරීම නිවාස අංශය වෙතින් නිසි ලෙස ඉටුවෙන කාර්ය භාරයකි. මෙම සියලු නිවාස නියමිත වර්ණවලින් වර්ණ ගැන්වීම ද මෙහිදි මූලික ලෙසින් සිදුවේ. Brilient white" Apricot white යන වර්ණයන් නිවාසවල ඇතුළත බිත්ති සඳහා, පිටත බිත්ති වර්ණ ලෙස Brilient white, Camio. Turmeric, Country Cream, Magnolia යන වර්ණයන් ද, දොර ජනෙල් සඳහා සුදු පැහැය ද, වඩිම්බු ලෑලි වැහි පීලි සඳහා අලු හැහැය ද භාවිත වේ. මේ සඳහා අනුමත වී ඇත වර්ණයන් වේ. නිවැසියන්ගේ ඉල්ලීම් ඉදිරිපත් කරන පරිදි වසර තුනකට වතාවක් මෙලෙස වර්ණාලේප සිදුකිරීම කරනු ලබයි. නිවාස පරිහරණයේ දී 1996.03.29 වැනි දින ගරු වරාය සභාපති සහ සේවක මණ්ඩල කළමණාකරුගේ සෙකො/සුපරිශ්‍ර/2/9/6/44 යටතේ ලේකම් කාර්යාලීය චක්‍ර ලේඛණ අංක 146 හා සේවක මණ්ඩල චක්‍ර ලේඛණ අංක 126 යටතේ නිවෙස් හිමියන් විසින් සිදුකළ යුතු සුළු නඩත්තු වැඩ සම්බන්ධ උපදෙස් මාලාවක් වරාය නිවෙස් හිමියන් වෙත ලබා දී ඇත. ඊට අමතරව පහත සඳහන් උපදෙස් අනුව නිවෙස් හිමියන් ස්වකීය නිවාස තබා ගැනීම ඔවුන්ගේ වගකීම වේ.

- ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා වැහිපීලි, නිවසේ කානු පද්ධති, නිවස හා ගෙවත්ත දිනපතා පිරිසිදු කර තබා ගැනීම.
- නිවසට අනවසරයෙන් තමාට රිසි පරිදි කොටස් එකතු කර ගැනීමෙන් වැළකීම.
- අනුමත වර්ණයන්ගෙන් තොරව තමාට රිසි පරිදි නිවෙස් වර්ණ ගැන්වීමෙන් වැළකීම.
- සුරතල් සතුන් ඇතිකිරීමෙන් වැළකීම.
- තමාට ලබාදුන් නිවසේ අනවසර පුද්ගලයින් නවතා ගැනීමෙන් වැළකීම.
- සෙසු වරාය නිවාස වාසින් හට අවහිරයක් නොවන ලෙස හැසිරීම.
- තම නිවාසවල වෙළඳ ව්‍යාපාර කටයුතු කිරීමෙන් වැළකී සිටීම.
- නිවාස පදිංචිය සඳහා ලබා ගෙන පදිංචි නොවී සිටීම.

යන කරුණු පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය.

වරාය නිවාස දේපල හා භූමියට හානි වන සේ අධිකාරියේ හෝ බාහිර පාර්ශවයන් විසින් සිදු කරනු ලබන අනවසර ඉදිකිරීම්

නිවාස, තාප්ප, ආරක්ෂක කඩා හානි සිදු කිරීම්, කාණු මාර්ග වෙනස් කිරීම්, වරාය භූමිය අනවසරයෙන් අල්ලා ගැනීම හා වරාය භූමියට අපද්‍රව්‍ය දැමීම ආදී සියලු කරණු සම්බන්ධව නිවෙස් හිමියන් විසින් පරශ්‍ර අංශය හා ආරක්ෂක අංශය දැනුවත් කර එහි උපදෙස් අනුව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

සුළු පරිමාණයේ නඩත්තු කිරීම් කටයුතු එම නිවැසියන් විසින්ම සිදු කරගත යුතු අත සෙසු සියළුම ගනයේ නඩත්තු කිරීම් කටයුතු නිවාස අංශය විසින් සිදු කරනු ලැබේ.

සියලුම නිවාසවල ජලනල අලුත්වැඩියා කටයුතු සිදුකිරීම, බ්ලූමැන්ඩල් අබ්දුල් හමීඩ් නිවාස සංකීර්ණ මෙන්ම තනි තනිව පිහිටි නිවාස පරිශ්‍රයන්ට අයත් භූගත ජල ටැංකි නිසි පරිදි පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු සිදුකිරීම, විදුලි අංශයේ දායකත්වයෙන් විදුලි නඩත්තු කටයුතු සිදු කිරීම, කානු පද්ධති යාවත්කාලීන කිරීම හා නඩත්තු කටයුතු සිදු කිරීම ද නිවාස අංශයේ මුඛ්‍ය වගකීමකි. නිල නිවාසයන් හි අන්තර්ගත වට්ටෝරු භාණ්ඩයන් හෙවත් වතුර මෝටර්, පයිප්ප, උළුවහු, දොර අගුල්, සරනේරු, නාන කාමර උපාංග, විදුලි පංකා, ස්විච් ආදිය ආරක්ෂාකාරී ලෙස භාවිතය නිල නිවාස භාවිත කරන්නන්ගේ වගකීමක් වන අතර ඒවා නඩත්තු කිරීම නිවාස අංශය සතු වගකීමකි.

නිවාස අංශයෙන් නිවාස භාර ගැනීමේ දී වට්ටෝරු භාණ්ඩ නිවැරදිව පරීක්ෂාකර බලා භාර ගැනීම සහ නැවත නිවාස අංශයට නිවාස භාර දීමේ දී වට්ටෝරු භාණ්ඩ නිවැරදිව භාර දීම නිවෙස් හිමියන්ගේ ප්‍රමුඛ වගකීමක් වන්නේ ය. ඉතා සහන මිළක් යටතේ කොළඹ නගර සීමාව තුළ වරාය අධිකාරියේ සේවක මහත්ම මහත්මීන් සඳහා ලබා දෙන නිවාස හොඳින් පරිහරණය කරමින් නඩත්තු කටයුතු සඳහා පැමිණෙන වරාය සහෝදර සේවක මහතුන්හට උපරිම සහාය දක්වා වරායේ වත්කම් හා දේපල ආරක්ෂා කර ගැනීමට දායක වීම නිවාස හිමියන්ගේ පරම යුතුකම හා වගකීම වන්නේය.

නිල නිවාස පරිශ්‍රයන්හි පිහිටි අනතුරුදායක ගස් පිළිබඳ අවධානය යොමු කර ඒවා කපා ඉවත් කිරීම ද නිවාස අංශයෙන් සිදුවන අත්‍යන්ත කටයුත්තකි. කොස් ගස් ආදිය විශේෂිත ගස් වර්ග කැපීමේ දී නිවාස අංශයට අදාල නොවන අතර එය ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියට යටත්ව දැව සංස්ථාව විසින් සිදු කළ යුතුය. මේ සියලු කටයුතු ප්‍රධාන ඉංජිනේරු (සිවිල්), නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු (සිවිල්), අධිකාරි (සිවිල්) ඉංජිනේරු, ඉංජිනේරු නිවාස හා වැඩ කළමණාකරු (නිවාස) යන නිලධාරීන්ගේ අධීක්ෂණයෙන් යුතුව සාමුහික ප්‍රයත්නයක් ලෙස සිදු කෙරේ.

වරාය නිවාස නඩත්තු කටයුතු වලදී නිවාස හා බ්ලූමැන්ඩල් වැඩබිම්වල නිලධාරීන් හා සේවක මහත්ම මහත්මීන් හට ද එම නිවාසයන්හි විදුලි නඩත්තු කටයුතු සිදුකරන නිලධාරි මහත්වරුන් හා සේවක මහතුන් හට ද මහජන සෞඛ්‍ය පරීක්ෂක අංශය සිදු කරනු ලබන නිවාස පිරිසිදු කිරීම් හා භූගත අපජල පද්ධති නඩත්තු කටයුතු සඳහා සම්බන්ධවන නිලධාරි මහතුන්ගෙන් හා සේවක මහතුන්ගෙන් සිදුවන සේවයට විශේෂයෙන්ම ස්තුති පූර්වකව සිහිපත් කළ යුතුය.

**විශේෂ ස්තූතිය**
**හේමන්ත විජේවර්ධන මහතා**
**වැඩ කළමණාකරු (නිවාස)**

**සටහන - උපුල් ගුරුගේ**



# සුදී

## ඓතිහාසික නවකථාව

**භය වන දිගහැරුම...**



උඹලයි කෝමෙයි මගේ සරීරෙට අත තියන්නේ නාකි වුනාට මමත් ගෑනියෙක්, එන්න කියාපං උඹලැයි නෑම්බියෙකුට මාව පරිස්සා කරන්න ඕනෑ නම්

තමුන්ගේම ලෙයින් මසින් හැදිච්ච දරුවා ගැන මහතනීගේ හිතට දැනුනේ කිසිම වචනෙකට නගා ගන්න බැරි තරමේ පින් සිතුවිල්ලක් දෙයියනේ කියලා මට කිසිම බයක් හැකක් නැතිව නේත්තණ දෙක පියාගන්න පුළුවන්. මහතනී තමුන්ටම කියා ගත්තා. ඉෂ්ඨ දේව දේවතාවන්ට සංහිඳේ කිරි අහර පූජාවක් කරන්නත් මහතනී හිතා ගත්තා.

පිටි වෙන්න අඹරාගත්ත මැටි චූර්ණ මාළිග යෙන් ඇන්න ආපු රිදී පැසේ දමා ගත්තු මහතනී බොහෝම සැහැල්ලු සිතින් මාළිගෙ ...ට පිය මැන්නා.

දිය අගලට මෙපිටින් තියෙන මුර අටල්ලේ රාජකාරියේ ඉන්න ඇටිකිත්තන් හේවායෝ ටික මහතනීගේ ඉහ ඉඟ අතගාලා පරිස්සා කරන්න සූදානම් වුණා.

හ් ...නේ... උඹලයි කෝමෙයි මගේ සරීරෙට

අත තියන්නේ නාකි වුනාට මමත් ගෑනියෙක්

එන්න කියාපං උඹලැයි නෑම්බියෙකුට

මාව පරිස්සා කරන්න ඕනෑ නම්,......

යකෝ මේකිගේ රාජ උස්නේ බලාපල්ලකෝ. බිසොවුන් වහන්සේ කෙනෙක් කියා හිතාන ඇති''

''උඹලට ඒවායින් කාරි නෑ. මාව පරිස්සා කරන්න ඕනෑ නම් සුනංගු නැතුව එන්න කියාපන් බවලතෙකුට''

''සොබනි ඇත්තියේ මෙහෙ වරෙන් ඇබින්දකට ''

'මොකෝ බොලා කෑමොර දෙන්නේ ඩිංගිත්තක්වත් විවේක ගන්න දෙන්නැතිවා... අපොයි දෙවියනේ මේ සුදී ඇත්තගේ මැණියන් දෑ නොවැ. කොල්ලනේ තොපිට අමු කැවිලැයි සුදී ඇත්තිගේ මැණියන්දෑව බොලා අඳුන්නේ නැතිවා බොහෝ ම

අපූරුයි. බොහෝ ම අපූරුයි....

සොබනි ඇත්තිගේ වචනවල තිබිච්ච ගොරෝසුකමට මුර අටල්ලට අළුතෙන් බඳවාගත්තු මුර පන්නේ කොලු නඩේම තක්කු මුක්කු වෙලා බලාන හිටියා.

''අපේ රජ්ජුරුවන් වහන්සේගේ නායක සෙනෙවි සුධීර උත්තමයා අතගන්න ඉන්නේ මෙතුමියගේ දෝණියන්දෑ බව හැබෑවටම උබලා දන්නෙ නැතෙයි.

සොබනි ඇත්ති මේ තරම් තමාට ඇඟෑලුම්කම් පාන කාරණාව මහතනීට තේරුණේ එතකොටයි. දෝණියන්දෑ ගැන හිතේ තිබිච්ච ආදරේ ගව්රවේකට පෙරලිලා හිත ඇතුළේ අමුතුම විපරියාසයක් කරනවා මහතනීට දැණුනා. රජ ගෙදර අන්ත:පුරේ ඇත්තියන්ව මැටි චූර්ණ තනන තමුන්නේ දෝණියන්දෑ රාජ මහේෂිකාවක් තරමටම විසේස වේගෙන එන හැටි ගෝතපබ්බත විහාරේ එළිවැටක් තරමට හිත පිරෙව්වා.

සුදී උන්ගේ අතීරණේක. තමුන්ගෙයි සුධිර ඇත්තන්ගෙයි පලහිලව්ව ගැන මාළිගාවේ හුඟ දෙනෙක් දැනන් හිටිය බව මේතාක් දුරකට සුදිගේ හිතට ගෙනාවේ ආරස්සාකාරි හිතුවිල්ලක්. ඒත් ඒ කාරණාව තවදුරටත් වලංගු නැති බව සුදීගේ නේත්තරා ඉදිරියේම පේන්න පටන් ගත්තා. පසුගිය දොහොක මැණියන් කැටිව එන්නට අන්තඃපුර මාළිගා ඉසව්වට ගියපු දොහේ නාකි පෙරෙවි බමුණෙකුගේ කතාවට සුදීගේ පංචස්කන්දේ ආයෙමත්

'' ආ ...සුදී කෙල්ලේ... උඹ රාජ කුමාරිකාවකටත් වඩා හැඩයි නොවැ... හැබෑව හැබෑව නැත්නං කොහොමයි අර තරම් උදාර සෙනෙවි කෙනෙක් දපනේ දාගන්නේ.... ඒත් කෙල්ලේ දැන්නම් ඒවා ඊෂ්ට වෙන්නේ නැතිවා .... උඹේ පියයි සුධීර ඇත්තොයි ආයේ එනවානම් ඉතින් මේ සම්මජ්ජාතියේ දී බොරු උන්දල නෞකාවට ගොඩවුණොත් මාරයාගේ අසුභ හෝරාවේදීමයි. මේ මමමයි ඒ නැකත තනා දුන්නෙත්...

බවලතෙක් වගේ කෙකර ගාමින් හිනාවෙන, තමුන්ව ගිලින්න වගේ බලා ඉන්න වයසක පෙරෙවි බමුණගේ මූණටම කෙළ පීඩක් ගැසීමේ සිතවිල්ල ආයාසයෙන් මැඩගත්ත සුදි වදන් කිහිපයක් අමාරුවෙන් ගැට ගහ ගත්තා.

''ඔබතුමා ඒ වගේ නොහොබිනා දෙයක් කලේ ඇයි බමුණුතුමනි.

උබ .. උබ...උබ..

උබ තමයි බොල මේ හැමදේටම මුල....

බලාපන් කිලෝගානක් බර රන් රිදී මුතු මැණික් පෙරවාගෙන ඉන්න දුටුව මතින් හිස රුජා හැදෙන කොණ්ඩා සැරසිලි කොරාන ඉන්න රන් දෝළියකටත් වඩා උඹ කොයිතරම් හැඩකාර ද කියා, එහෙව් එකේ මගේ දුක් ගන්නා ඇත්ති වෙන්න උබට බැරාවා... උබට රන්දෝලියකටත් වඩා සැප සලසන්න මට හැකි බව උඹ දන්නවා...

සුදීගේ හිතේ අරක්ගත්ත දේවතාව සුදීට උපදෙස් දෙන්න පටන් ගත්තා.

'සුදියේ හිත පාලනය කරගන්. ගිනි පිටවෙන කේන්තිය මේ අපුරු බමුණාට පෙන්නන්නැතිව ඉන්න තාක් දිනුම තමුන් ලඟ තියෙන බව සුදී අමතක කරන්න එපා. වාග් ප්‍රහාරයෙන් තී මේ අජූත බමුණාව පරාද කල යුතුයි''

හිතේ ඇතුළතින් ඇසුණු මේ හඬත් එක්කම සුදීගේ හිතට අමුතුම පණක් ආවා.

''අනේ අපගේ පූජණීය බ්‍රාහ්මන තුමා කොයිතරම් උදාරයි ද. මගේම පියාගේ වයසට වඩා වැඩි වයසේ පසුවන ඔබතුමා භද්‍ර යෞවනයේ සිටින මා දරුකමට හදා ගැනීමට සිතීම පවා මට සිහිලත් බමුණුතුමා. ඒත් මෙතුවක්කල් දරුඵල නැතිව ඉන්න ඔබ දෙපල මව පියා නොමැති අනාත දරුවෙකු පැටිවියේදීම ඇතිදැඩි කළා නම් තමා සුභඵල දායක වන්නේ.

සුදීගේ වචන බොහෝම පැහැදිලියට කරුණාවන්තව ගලා ගියත් නුවරක් දමා අළු කරවන තරමේ දෑස්වලින් කියාපාන කේන්තිය හමුවේ එය නොදැක ඉන්නට මහළු බමුණා අසාර්ථක උත්සාහයක යෙදුණා.

''කෛරාටික වෛශ්නාවි... මම උඹට මගේ තරම පෙන්වන්නම්... හිතින් තමාටම සපථ කරගත් පෙරෙවි බමුණා වේගයෙන් සුදි පසුකරගෙන ගියා.

උපුල් ගුරුගේ

# කාව්‍යාංජලී

තොටුපලේ කවිතොට

### සේද මාවතේ රුවන්දොර

හැකිමය සේද මාවත ජය ගැණුම හෙට
සපයන සහය ගැන ලොව දතයුතුව අද
සේවය කරන අපගේ හැකිකම ලොවට
පෙන්වා දියුණු කළ යුතුවෙයි කොලොම්තොට

ලොව පරසිද්ද නැව් තොටවල් අතර හිඳ
පෙරමුණ ගෙන සිටියි අපගේ කැණි මඬල
මසුරන් පොදි වලින් සරසා අප දෙරණ
සුරකිමු නගමු සරසමු අප රුවන් දොර

- හඳගම -

### වනස්පති නුඹ ය

දෙඅත් අතර
අප මහා බර
දරා සිටිය
ජාතියේ හදවත ඔබය
මව්බිමේ දරු පැටව්ගේ
අනාගතය
අධිෂ්ඨාන ශක්තිය
දිරිය ඔබය
කටු මුගුරු මතින්
නැගී සිටිය
රැයක් පහන් කර
උදාවෙන හෙට දිනය
රැකේවා දිනේවා මතු
දවසෙත්
ජාතියේ හදවත

රෝහිත හේමන්ත
- ආරක්ෂක

### ඉටුකරන්නම් එක්ව අපි සැම ඔබේ සේවය හදවතින්

සරා සඳ දිය ගලා හැලෙනා
නේක නැව්තොට පසුකරන්
කොළොම්තොට වෙත
පියමනින සඳ
දහස් පැතුමන් පොදි බැඳන්
ඉටු කරන්නම්
එක්ව අප සැම
ඔබේ සේවය හදවතින්
පෙරදැරිව
ලක්මවට හිමි
අදරබර සත්කාරයෙන්

- අශේකා රණතුංග -

### අතීතය

අඟුරු මඩුව ලඟ- ලුණු අහුලන්නට
ආත්තම්මත් ආවලු ඒ කාලේ
බත්තලේ වැඩකළ සියාතාත්තාට
ආත්තම්මා හදි ගැහි කෝලිත්තං වුණාලු.....
කොලුකමට සීයාතාත්තා එක්ක
බතත්ලට ආව ගිය
අපේ තාත්තත්

බත්තලට ම හරි ගියාලු...
සැසඳුමේ බිල් ලියපු උපසේන මහත්තයා
දෝණියන්දට හොයපු මනමාලයා වුණොත්
අපේ තාත්තලු...
අඟුරු මඩුවේ කතා අහගෙන
හාබර් බතේ ලුණු ඇඹුලින්ම
උස්මහත් වෙච්ච කරදඩු
කෝටියක් සිහිනවැල්
අපේ ජීවිත හැඩකළා
වැඩකරන කළ බහලුවේ ජය
මතක බණවර දෙයි රිදුම්
සීයාතාත්තගේ අපේ තාත්තගේ
අඟුරු මඩුවේ මතක රොන්සුණු

ලලිත් සේනානායක - ක්‍රියාකරවන

### වරායේ දිරිය හදවත්

බඩු බාන පටවන මෙහෙයුමේ
යන්තරේ නුඹයි දිවා රෑ
වෙහෙස නොබලා
කරන සේවය අගෙයි වටිනා
හෙළන දහදිය බිඳුවකට ඔබේ
ණය ගැතියි අපි සොයුරණේ
නොම වැටෙන්නට දී
රැකුමට වෙහෙසෙන
නුඹේ සවිබල
මව්බිමේ හදවතම බඳු වූ
මවුනි අදරබර
කොළොම්තොට
රැකදෙන්න දිරිදෙන
නේක පැහැයෙන්
වර්ණවත් වූ පුංචි තරුඑළි
නුඹයි දිලෙනා
සොඳුරු නැව්තොට
සරු කරන්නට වෙහෙසෙනා...

නිශාන්ති ගුණසේකර
- සේවා සැපයුම්

### කොළොම්තොට අසිරිය

දැනේ යලි යලි
පැවසූ සේම කිව්වරයෙකු
නොම මහලු බව
විසල් කොලොම්තොට
ඔද වැඩි
මවා තෙද ගති
නේක වියමන
කෙම්බිමක් වී
ගොඩනැගී ඇති
සොඳුරු අන්දම

- කාවින්ද රන්සර -

### ඇයට අහිමි උරුමය

සොබාදහමෙන් හිමි වුණ
නේක සම්පත් බහුල
දායාදයන් අපේ
මතු පරපුරට,
උරුම නොවෙනා වගයි
පසක් වනුයේ
පරදේශයින් හට
ටිකෙන් ටික
උරුම වනයුරු
කෙසේ නම් උහුලයි ද?
මගේ ලක්මවුන්
ඇයට,
අහිමි වන
උරුමකම......

- මාලිකා අබේරත්න -

### මහපොළ විදු පියස

උදා අරුනළු
සේම පැහැබර
දැනුම කිතුගොස
නිති ලබා දෙන
සොඳුරු නැව්තොට
එකලු කරවන
සහස් තුනු දන
දිවි බබලවන
නැව් තොටක
පිපි
දැනුම් සියපත

ප්‍රියංගි - මහපොළ

### කොළොම්තොට අවදි වී

හිරු කිරණ බිම සිප ගනිද්දි
සයුර රළ සසලව නැගෙයි...
උදය පිබිදී දනන් තම
බත සරිකරන්නට පිය මනියි

රැයද දහවල එකෙකු ලෙස
සිත කය ද වෙහෙසා දිරිය දෙයි...
කන්තොරුවේ ගැන්ට්‍රියේ
දිවි සිරකරන් දැය සරසවයි...
කොළොම්තොට මිණි පහන වී
සිරිලකට ආලෝකය සදයි
දැයට බල දෙන ඔබ නමට
මල් මාලා පලදම්
හෙට සුබයි.

ප්‍රසාන් අනුරාධ ගුණසේකර

### ප්‍රාර්ථනා

නවලොව තරගයට පෙර දින පිවිසෙන්න
හදවත ජාතියේ යලි පණ ගන්වන්න
සේවක හදවතේ හෙට මා පුබුදන්න
කොළොම්තොටේ අභිමන මතු රැකදෙන්න

නිහාල් චන්ද්‍රසිරි -ජයබහලු



හොඳම කාව්‍ය නිර්මාණයට
සමුද්‍ර වෙත්තසිංහ ප්‍රකාශන ආයතනයෙන්
විශේෂ තිළිණයක් සහ කාව්‍ය ඇගයුමක්

## වෛද්‍ය වෘත්තිය වගේම කවියත් මට බොහෝම සමීපයි...

### වෛද්‍ය සේරසිංහ

ඉසිවර වෙද දැනක රැඳුණු පන්හිඳ නිදහසේ ඉසිඹුවක කවි කම් කළ අපූරු සහෘදයෙක් කොළොම්තොට කවිතොටේ දී අපට හමුවුණා. ඔහු වෛද්‍ය එස්.සේරසිංහ මහතා. ජීවිතයේ එක් එක් හැරවුම් ලක්ෂය ලෙස උපේක්ෂාවෙන් බලමින් ජීවිතය විනිවිදින ඔහු ස්වකීය අත්දැකීම් කවි බවට පෙරලා තිබුණා.

රන්වන් පාට හිරු දෙවි පෙරදිග අහසේ
හෙමිහිට මතු වෙනවා හිතැගි ඔබේ මනසේ
සියොතුන් කැළක් මවමින් රවුමක් අහසේ
කුල්මත් කරනවා හිත හිමිදිරි දවසේ

වරාය අප සැමගේ ජීවිත ආලෝකමත් කරන අපේ වරාය පිළිබඳ ඔහු ස්වකීය කවීත්වය මුසු කළේ මේ ලෙසින්,

කොළොම්තොට නැව්තොට හෙවත්
සෙනෙහසේ මැණියන් ඔබ තමා
අපේ ලක්මැණියගේ ආදරණිය දුවණිය ඔබ තමා
සිරිලක මිහිකත විසින් දායාද කළ නැව්තොට තමා
දැසම නංවන ස්වර්ණමාලි දෙව්ලියන් අපේ ඔබේ තමා

ලෙසින් කොළොම්තොට ජීවය දෙන උප නායකත්වය ඔහු කවියට නැගුවේ මේ ලෙසින්

කොළොම්පුර නැව්තොට අධිකාරියේ සේවය කරන මහතෙකි
උපසභාපති නිලය දරමින් රටට සේවය කරන උගතෙකි
දන උගත්කම සරල බව ජීවිතේ හොඳටම විදින බවතෙකි
මිනිස්කම ඉහළින් තබාගෙන රාජකාරිය කරන වියතෙකි

# කොළොම් තොටින් සමු ගන්න ද හදවතින් අප ඔබ සමගයි

## පසුගිය දා වරාය අධිකාරියේ සේවයෙන් සමුගත් සේවක මහත්ම මහත්මීන්


සමගි බහළු පර්යන්තයේ සේවය කළ ඒ.ඩී. ආරියරත්න මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


ජයබහළු පර්යන්තයේ සේවය කළ කේ.එච්.යූ.සී. කාරියවසම් මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


CFS iv හි සේවය කළ ඒ. ටියුඩර් මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


සැපයුම් කොට්ඨාශයේ සේවය කළ ඒ.ඒ. ලීලාවතී මහත්මිය, වරාය සේවයෙන් සමුගත් දා...


සිවිල් ඉංජිනේරු කොට්ඨාශයේ සේවය කළ ඩී.එම්. ලක්ෂමන් පද්මසිරි මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ සේවය කළ ඩී.එම්.පී. සෝමාවතී මහත්මිය, වරාය සේවයෙන් සමුගත් දා...


සිවිල් ඉංජිනේරු කොට්ඨාශයේ (ගොඩනැගිලි උතුර) සේවය කළ හේමන්ත මැන්ඩිස් මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


වානේ නිමවුම් අංශයේ සේවය කළ කේ.ඒ. ඩෙන්සිල් මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


ජයබහළු පර්යන්තයේ සේවය කළ කේ.ඒ. නිමල් හේමචන්ද්‍ර මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


ජයබහළු පර්යන්තයේ සේවය කළ ඒ.ඩී. ආරියරත්න මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


වෑද්දුම් අංශයේ සේවය කළ ලයනල් කරුණාදාස මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


ජයබහළු පර්යන්තයේ සේවය කළ එම්. බුද්ධදාස මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


ජයබහළු පර්යන්තයේ (සිවිල්) සේවය කළ පී.ඒ.එම්.ඒ. ජයසේකර මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


ජයබහළු පර්යන්තයේ සේවය කළ පී.ඒ.ඩී. ජයරත්න මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


ජයබහළු පර්යන්තයේ සේවය කළ සරත් රත්නසිරි මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


ආරක්ෂක කොට්ඨාශයේ සේවය කළ එම්.ජී. ප්‍රේමරත්න මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


ආරක්ෂක කොට්ඨාශයේ සේවය කළ එස්. ජයසිරි මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


වතුර අංශයේ සේවය කළ එස්.එන්. ජයවීර මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


ප්‍රධාන ගබඩා පරිශ්‍රයේ සේවය කළ සේනක ද සිල්වා මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


ජයබහළු පර්යන්තයේ (විදුලි) සේවය කළ ඩබ්ලිව්. විජයශ්‍රී මහතා, වරාය සේවයෙන් සමුගත් දා...

## 8 நாடுகளின் பங்குபற்றலுடன் சர்வதேச ஒருங்கிணைந்த துறைமுக கட்டமைப்பு மாநாடு

சர்வதேச ஒருங்கிணைந்த துறைமுக கட்டமைப்பின் 19 ஆவது மாநாடு கொழும்பு கிங்ஸ்பெறி ஹோட்டலில் துறைமுகங்கள் மற்றும் கப்பற்துறை அமைச்சர் மஹிந்த சமரசிங்ஹ அவர்களது தலைமையில் ஆரம்பமாகியது. பங்களாதேஷ், சீனா, இந்தோனேஷியா, ஜப்பான், தென் ஆபிரிக்கா, தென்கொரியா, பிலிப்பைன்ஸ் மற்றும் இலங்கை என 8 நாடுகளின் பிரதி நிதிகள் இந்த மாநாட்டில் கலந்துகொண்டுள்ளனர்.

நாடுகளுக்கு இடையிலான துறைமுகம்சார் ஒத்துழைப்புக்களை மேம்படுத்துவதற்கான ஒன்றாகவே இந்த மாநாடு அமைகின்றது. மேலும் பொருளாதாரத்தை கட்டியெழுப்புதல், சுற்றாடல் தொடர்பாக அறிவுறுத்துதல் என்பன இந்த மாநாட்டின் முக்கிய விடயங்களாக காணப்படுகின்றன.

இம்மாநாடானது இம்முறை இலங்கையில் நடாத்துவதனால் சர்வதேச ரீதியில் இலங்கையை பொருளாதார ரீதியில் முன்னிலைப்படுத்த எதிர்பார்க்கப்படுகின்றது.

## மறக்க முடியவில்லை

கனவுகளோடு காத்திரு
காதலோடு வருவேன் என
சந்தம் சொன்ன
அவளது சொந்தம்
இன்று சொப்பனமாய்
போனதேனோ?!

மழை விழும் மாதம்
மழை இட வருவதாய்
மணவறைக் கனவு தந்தவள்
மறந்து போனதை
மனசு தாங்குமா?

அன்றி....
ஒன்று சேர்வதற்காய்
ஒவ்வொரு நொடியும்
ஒத்திகை பார்த்தவள்
ஒதுங்கிப் போவதைத்தான்
ஒத்துக் கொள்ள முடியுமா?

எனது
காதலின் கணக்கை
செலவில் எழுதிப் போனவளை
மனிதக் கணக்கினிலே
எப்படி
வரவில் வைப்பேன்

ஒரமாய்
ஒதுக்கப்பட வேண்டிய
அவளது நினைவுகள் எல்லாம்
எனக்குள் தானே
ஒதுங்கிக் கொள்கிறது....

முடியவில்லை
அவள்
தந்து போன
காதலின் நினைவுகளை
மறந்து போக -முடியவில்லை!

மறப்பதற்காய்
எடுக்கப்படும்
முயற்சிகள் எல்லாம்
தோற்றுத்தான் போகிறது
அவளது காதலைப் போல...

ஏ. எல். கயஸ்
பாதுகாப்புப் பிரிவு - ஒலுவில்.

### இறப்பின் அச்சம் இறப்பாகி !

எவருக்கும் அஞ்சாமல் காத்திருக்காமல்!
காலம் தேய்ந்து கருகியே செல்கின்றது!
காலங்கள் காலமாகி!

தன் உடல் தேய்வதை உணர்ந்தும்!
ஊனமாய் அழுபவன்!
காலச் சக்கரம் சவர்க்காரம் போல் தேய்வது பற்றி!
எப்போதும் அச்சப்பட ஏன் மறுக்கிறாய் மானிடா!

ஒரு சில கணப் பொழுதில் படைக்கப்படும்
பானை போல்,
இறப்பை தூக்கி வந்து
காலம் எமதான
மனைகளில் திடீர் குதிக்கிறான்
மரண ஆசான்
மரண ஆசானை மறக்கடிக்க
மருந்துண்டோ இப்பாரினில்? ......

எம்.ஐ. இஸ்ஸதீன் - உள்ளக கணக்காய்வு பகுதி

## உலகின் பாரிய கொள்கலன் கப்பல் தெற்கு ஆசியாவின் கொழும்புத் துறைமுகத்திற்கு கன்னி விஜயம் - கொழும்புத் துறைமுகத்தில் நினைவுச் சின்னம் பரிமாறப்பட்டது.




உலகின் பாரிய கொள்கலன் போக்குவரத்து கப்பலொன்று கொழும்பு துறைமுகத்தை வந்தடைந்துள்ளது. வந்தடைந்த இந்தக் கப்பலின் முதலாவது தெற்காசிய விஜயம் இதுவேயாகும். கொழும்பு துறைமுகத்தின் வந்தடைந்த கப்பலின் முதல் வருகையை நினைவு கூறுமுகமாக நினைவுச் சின்னப் பரிமாறல் CICT முனையத்தின் MvMilan Maersk கப்பலில் நடைபெற்றது. நினைவுச் சின்னப் பரிமாறல் நிகழ்வில் கப்பலின் மாலுமி Jog van Peter Son (ஜொங் வேன் பீடர்ஸன்) அவர்களுடன் இலங்கை துறைமுக அதிகாரசபை, கொழும்பு சர்வதேச கொள்கலன் முனையம் (CICT) Maersk கப்பல் வலையமைப்பு கம்பனியும் கலந்து கொண்டன.

உலகின் மிகப் பாரியதும் விசாலமானதுமான கப்பல்களில் ஒன்றான இந்த MvMilan Maersk கப்பல் இந்த வருடத்தில் நிர்மாணிக்கப்பட்டது. இது கொள்கலன் 20568 TEU கொள்ளளவினை உடையதுடன் 212400 டொன்களை போக்குவரத்து செய்ய முடியும். முழு நீளம் 399 மீற்றர்களாகும். அகலம் 58 மீற்றர்களாகும். கப்பல் டென்மார்க் கொடியின் கீழ் பயணிக்கின்றது.

இந்த நிகழ்வில் கலந்து கொண்ட இலங்கைக்கான அமெரிக்க தூதுவர் அதுல் கேஷாப் அவர்கள் கூறியதாவது இலங்கை இந்து சமுத்திரத்தின் கப்பலோட்ட மத்திய நிலையமாக மிக உயரிய செயற்திறன் மிக்க சேவையினை வழங்குவதனையிட்டு பாராட்டுவதுடன் அதன் மேம்பாடு குறித்து தேவைப்படும் செயற்பாடுகளுக்கு ஒத்துழைப்பினை நல்குவதற்கு தமது நாடும் ஒன்றுசேரும் எனவும் குறிப்பிட்டுள்ளார்.

இலங்கை துறைமுக அதிகாரசபையின் தலைவர் கலாநிதி பராக்கிரம திஸாநாயக்க அவர்கள் இச்சந்தர்ப்பத்தில் Maersk நிறுவனத்திற்கு தமது நல்லாசிகளை தெரிவித்து கூறியதாவது “Maersk நிறுவனம் கொழும்பு துறைமுகம் மீது வைத்துள்ள நம்பிக்கைக்கு நன்றி கூர்கின்றேன். என்றும் Maersk நிறுவனம் கொழும்புத் துறைமுகத்தில் கொள்கலன் கையாளல் கொள்ளளவினை முன்னேற்றிக் கொள்வதற்கு நல்கும் பங்களிப்பனை எதிர்வரும் காலங்களிலும் தொடர்ச்சியாக வழங்கும்” எனவும் தான் நம்புவதாகவும் தெரிவித்தார்.

இந்த நிகழ்வில் கலந்து கொண்ட Maersk இந்திய தனியார் கம்பனியின் சிரேஷ்ட பணிப்பாளர் Julian Bevise (தெற்காசிய வலயத்திற்கு பொறுப்பான) உரையாற்றுகையில், இலங்கை துறைமுக அதிகார சபையானது கொழும்பு துறைமுகம் அபிவிருத்தியை நோக்கி கொண்டுள்ள போட்டி மிகு செயற்பாடுகளின் காரணமாக மிகச் சிறந்த சேவையினை வழங்குவதற்கு வாய்ப்பு கிடைத்துள்ளது எனவும் கூறினார்.

Mv Milan Maersk கப்பல் தனது கன்னிப்பயணத்தை மேற்கொண்டது, தனது பயண முடிவுப் பாதையின் மத்திய நிலையம் ஒன்றாகவேயாகும். இந்தக் கப்பல் வட ஐரோப்பா, ஐக்கிய இராச்சியம், நெதர்லாந்து மற்றும் ஜேர்மன் வரை தனது பயணத் தடவைகளை மேற்கொள்ளும்.

# කෙළිබිම

**ශක්තිමත් ජවයේ සංයමය**

සටහන - රුක්ෂාන් සමරධීර

## බැට්මින්ටන් පිරිමි/කාන්තා කණ්ඩායම් ශූරතාව ශ්‍රී ලංකා වරාය අධිකාරියට



පසුගියදා පැවති ජනසතුසේවා බැට්මින්ටන් පිලිමළුන් පිටු දැකීමේ තරඟ මාලාවේ පිරිමි (ප්‍රවීන) හා කාන්තා (ප්‍රවීන) කණ්ඩායම් ශූරතාව දිනා ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බැට්මින්ටන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත් විය.

මේ අතර විවෘත තරගාවලියේ පිරිමි (ප්‍රවීන) යුගල තරග සඳහා සහභාගි වූ මහේන්ද්‍ර තුඩුගල හා චමිල කරුපනාවල යන ක්‍රීඩකයන් දෙදෙනා එම කණ්ඩායමේ ශූරතාවය ලබා ගත්තේ ප්‍රබල ක්‍රීඩකයන් රැසක් පරාජයට පත්කරමිනි. එම කාණ්ඩයේම කාන්තා යුගල අනුශූරතාවය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනුෂා ගමගේ හා ධම්මිකා අධිකාරි විසින් හිමිකර ගත්හ.

ජනසතු සේවා බැට්මින්ටන් තරගාවලිය නිමාවූයේ වරාය අධිකාරියට ජයග්‍රහන රැසක් සමගින්ය.

## අන්තර් සමාජ ක්‍රිකට් තරගාවලිය "TB" 2016-2017 ශූරතාවය ශ්‍රී ලංකා වරාය අධිකාරිය ට

ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ක්‍රිකට් තරගාවලිය වන ක්‍රිකට් ආයතනය මගින් සංවිධානය කරනු ලබන අන්තර් සමාජ පළමු පෙළ තරගමාලාවේ 'T B' කොටසේ ශූරතාව දිනා ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමත්කම් දැක්වූහ.

මුල සිටම ආක්‍රමණශීලි තරඟ ස්වභාවයක් දැක්වූ ශ්‍රී ලංකා වරාය අධිකාරි ක්‍රිකට් කණ්ඩායම තරගාවලිය පුරාම තම අනසක පතුරවන ලදි. පසුගියදා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මගින් සංවිධානය කළ ක්‍රිකට් වර්ණ රාත්‍රියේ දී 'T B' තරගාවලියට හිමි කුසලානය ශ්‍රී ලංකා වරාය අධිකාරි කණ්ඩායමේ නායක චමින්ද බණ්ඩාර මහතා විසින් ලබා ගන්නා ලද අතර, එම සමස්ථ තරගාවලියේම හොඳම පන්දු යවන්නා බවට පත් වූයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ චාමික එදිරිසිංහ වීම ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෞරවයකි.

## කරාතේ ශූරතාවය දිනූ පුංචි හපන්නු



ආරක්ෂක කොට්ඨාශයේ රන්දික මහතාගේ පුතණුවන් හා දියණිය වන සයුරු දෙනුවන් හා යසාරා දෙව්මිණි ජාත්‍යන්තර විවෘත ෂෝතෝකාන් කරාතේ ශූරතාවලිය සඳහා සහභාගී වෙමින් විශිෂ්ට ජයග්‍රහණ අත්කර ගැනීමට සමත් වි ය.

එහි දී සයුරු දෙනුවන් 3,2,1 ක්සු පිරිමි කාතා හා 3,2,1 ක්සු පිරිමි කුමිතේ තරග අංශයෙන් ප්‍රථම ස්ථානය දිනා ගැනීමට සමත් වි ය. යසාරා දෙව්මිණි 10,9,8,7 ක්සු කාන්තා කුමිතේ හා කාතා තරග අංශ ද්විත්වයේ ප්‍රථම ස්ථාන දිනා ගැනීමට සමත් වි ය.

ග්‍රෑන්ඩ්පාස් හි ශාන්ත ජෝෂප් බාලිකා විදුහලේ තෙවැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන යසාරා ක්‍රීඩාකටයුතු වලට මෙන් ම අධ්‍යාපන කටයුතු වලට ද එක සේ දස්කම් දක්වයි.

යසිරු කොළඹ අශෝක විදුහලේ නව වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. යසිරු හා දෙව්මිණි කරාතේ ක්‍රීඩාවට යොමු වී වසර 04ක් පමණ ගත වන අතර, මේ වන විට ඔවුන් ලබා ඇති සම්මාන රාශියකි.

## 2017 ජාතික කෝ-කෝ ශූරතාවය ශ්‍රී ලංකා වරාය අධිකාරිය ට



ශ්‍රී ලංකා කෝ-කෝ සංගමය මගින් සංවිධානය කරනු ලබන ජාතික ශූරතාවලිය තෙදිනක් පුරා වීදාගොඩ ජාතික කෝ-කෝ ක්‍රීඩාංගනයේ දී පසුගිය දා පැවැති විණි.

දිස්ත්‍රික්ක 13කින් කණ්ඩායම් 15 පමණ සහභාගී වූ මෙම තරගාවලියේ පිරිමි අංශය සඳහා සහභාගී වූ දිවයිනේ ප්‍රබල කණ්ඩායම් රැසක් පරාජය කරමින් ජාතික පිරිමි කෝ-කෝ ශූරතාවය දිනා ගැනීම ට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කණ්ඩායම සමත් වි ය.

මෙම තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය දිනා ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කණ්ඩායම නියෝජනය කරමින් තරග කළ සහන් දිනෙත් කුමාර ක්‍රීඩකයා සමත් වි ය.

## කලකට පසු කසුන් පාපන්දු පිටියේ



ශ්‍රී ලංකා ප්‍රිමියන් ලීග් පාපන්දු තරඟාවලියේ දී සොන්ඩස් කණ්ඩායම නියෝජනය කරන කසුන් ජයසූරිය තරගාවලිය පුරා මේ වන විට සිය අනසක පතුරවමින් සිටි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රීඩා සමාජය නියෝජනය කරන කසුන් ශ්‍රී ලංකා පාපන්දු කණ්ඩායමේ නායකත්වය ඉසුලු ක්‍රීඩකයෙකි.

## ඉන්දියාව සතු ආසියාතික සහාය දිවීමේ වාර්තාව ශ්‍රී ලංකාව සතුකර ගනී



20 වැනි ආසියාතික ප්‍රවීනයන්ගේ මළල ක්‍රීඩා උළෙලේ දී මීටර් 400 සහාය දිවීමේ ඉසව්වේ නව වාර්ථාවක් බිහිකිරීමට ශ්‍රී ලංකා සහාය දිවීමේ කණ්ඩායමේ ක්‍රීඩිකාවක් සමත් වූහ. මීට පෙර මෙම වාර්ථාවට හිමිකම් කීවේ ඉන්දියාවයි. විනාඩි 4 යි තත්ත්පර 57 ක කාලයකින් තරගය නිමකරමින් නව මීටර් 400 වාර්ථාවක් ලෙස ශ්‍රී ලංකා නාමය යටතට ගෙන ඒමට ශ්‍රී ලංකා සහාය දිවීමේ ක්‍රීඩිකාවට හැකි වුණා. මීටර් 400 සහාය දිවීමේ කණ්ඩායම වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රීඩා සමාජය නියෝජනය කරනු ලබන ඒ.ජී.එන්. ආතාවුද ක්‍රීඩිකාව ද නියෝජනය කරන ලදි. මෙම මළල ක්‍රීඩා උළෙල චීනයේ රුගාඩ් ඔලිම්පික් මධ්‍යස්ථානයේ දී පැවැත්විනි.

# මුහුදු පතුලේ කෞතුකාගාරය
## Cancún Underwater Museum

ඇත්තටම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වුණේ අපේ මුළු ලෝකයටම නිහඬ සේවයක් කරපු ජීවී කොරල්පර වර්ධනය කර ගැනීමයි.

සාගරය සුරැකීමට කලාව උපයෝගී කරගනිමින් මාස 18 ක් පැය 120 ක් දිය යට වැඩ කරමින් මේ පුදුම නිර්මාණය ලොවට දායාද කළා. ඔහු මේ සඳහා පයිබර් ග්ලාස්, සිලිකන් වැලි 400 කොන්ක්‍රීට් වැලි යොදා ගනිමින් පිළිමයන් හි සෑම කෝනයකින් සෑම නිරූපනයක්ම පරිපූර්ණ කිරීමට ඔහු වෙහෙසක් ගත්තා.

අපි ගොඩාක් කෞතුකාගාර දකලා තියෙනවා. අහලා තියෙනවා. අපි ඒ කෞතුකාගාර වලට ගිහිල්ලත් තියෙනවා. ඒත් අහලා තියෙනවද දිය යට නිර්මාණය වූ හරි අපූරු කෞතුකාගාරයක් ගැන. ඔව්, මේ කෞතුකාගාරය තියෙන්නේ මෙක්සිකෝ හී ක්ජමබ හ්එසදබ්ක ජ්රන මුහුදු තීරයේ මීටර් 3-6ත් අතර ගැඹුරින්.

ජේම්ස් කොන්සාගෙල් කාන්ටෝ මහත්මා මෙම මුහුදු තීරයේ විශේෂිත වූ අමුද්‍රව්‍ය වලින් සැකසුණු කොන්ක්‍රීට් ප්‍රතිමා/මූර්ති මුහුදු පතුල යට තැම්පත් කරමින් මෙම කලාගාරයක් බඳු වූ කෞතුකාගාරය නිර්මාණය කළා.

2009 වසරේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය 2010 වසරේ නොවැම්බර් මස 27 වන දින නිල වශයෙන් සංචාරයකයින් සඳහා විවෘත කළා.

දේශීය, විදේශීය සංචාරකයින්ගේ නෙත් සිත් ඇද ගැනීමට සමත් වුණු මේ කෞතුකාගාරය අදටත් දියයට හරි අපූරුවට සංචාරකයින්ගේ සිත් සතන් මෙන්ම කොරල්පර ආරක්ෂා කිරීමට පෙර මඟ බලන් සිටිනවා.

**- මනු ද සොයිසා -**















# යෝධ පෙට්ටිය

අන්න අන්න යෝධ පෙට්ටියක් පාරේ යනවා.''

ඒවා පෙට්ටි නොවේ පුතා ඒවාට කියන්නේ බහලු කියලා.

බහලු ඇතුළේ තියෙන්නේ මොනවද? ගෝනි බිල්ලොද එකේ ඇතුළේ ඉන්නේ ? නැතිනම් ලොකු සතෙක් ද?

ඒ එකෙක්වත් නොවෙයි පුතේ. ඒවායේ ඇතුළේ තියෙන්නේ එක එක ජාතියේ බඩු භාණ්ඩ. ඇඳුම්, රෙදිපිළි, කෑම ජාති,.... තව තව ගොඩාක් ජාති ඒවායේ තියෙනවා.''

''ඒවා කොහේටද ගෙනියන්නේ''

''ඒවා ගෙනියන්නේ වෙනත් රටවලට''

ඉතින් තාත්තේ ඔය තරම් ලොකු පෙට්ටි කොහොම ද අහස් යානාවලින් අරන් යන්නේ ''

නෑ පුතා,...''ඔය වගේ බහලු පෙට්ටි අරන් යන්නේ මුහුදෙන්''

''ඉතින් තාත්තා ඔය පෙට්ටි මුහුදට දැම්මාම ගිලෙන්නේ නැද්ද?

' නෑ පුතා ඒ බහලු ගෙනියන නැව් තියෙනවා. ඒවාට කියන්නේ බහලු නැව් කියලා.. ඔය වගේ බහලු 15000 ක් විතර පුරවපු නැව් මුහුදේ යනවා.

''බුදු අම්මෝ'' ඒ තරම් ලොකු නැව් තියෙනවද''

'' ඔව් පුතා''...

''ඒ වුණාට තාත්තා මුහුදේ තියෙන නැව් හරි පුංචිනේ''

''එහෙම තමයි පුතා ගොඩාක් ලොකු දේවල් ඈතට පෙන්නේ පුංචියට''......

'' අනේ තාත්තේ අපි නැවක් බලන්න යමු''

හරි ... හරි .. පුතා අපි නංගිවයි අම්මවයි ත් එක්කගෙන නැවක් බලන්න යමු.''

''පුතා හොඳට ඉගෙන ගෙන ලොකු මහත්තයෙක් වුණාම ඔයාට දවසක නැවක් පදවන්නත් පුලුවන් වේවි.''

''ඔය ඇත්තම ද තාත්තා...!''

''ඔව් සුදු පුතා''


''මං එහෙනම් හොඳට ඉගෙන ගෙන අලුත්ම තාලේ නැවක් හදනවා''

''මගේ හොඳ පුතා''

*ගුරු මාමා*




**වනයේ අසිරිය**
සතිර සංදීප
4 වසර - බව/කැළ යටිහේන ම.ම. විදුහල




**මගේ සුරතල් බලු පැටියා**
නිමාලි හංසිකා
2 වසර - යශෝදරාදේවි බාලිකා විදුහල



**පළතුරු වට්ටිය**
සුලක්ෂණා මන්ත්‍රීන්දි
සසෙක්ස් විදුහල -ගාල්ල



**හංසයා**
සුපිපි දිනෙත්මා
දිලෙනතරු පෙර පාසල -බටකැත්තර



**නැවක ගමනක්**
චේතන් නිවාස්
ප්‍රාථමික අංශය -ලයිසියම් විදුහල-නුගේගොඩ



**වනයක අසිරිය**
අනුරුද්ධි සිල්වා
මාලමුල්ල -පානදුර

# තීරථ

# රට වටා පිහිටි සියලු වාණිජ වරායයන් සංවර්ධනය කිරීමට පියවර



ඔලුවිල් වරායේ සංවර්ධන කටයුතු නිරීක්ෂණය කරමින්...



ගාල්ල වරායේ සංවර්ධන කටයුතු නිරීක්ෂණය කරමින්...

ජාත්‍යන්තර තත්ත්වයේ සේවා සපයමින්, සේවාලාභීන් උපරිම තෘප්තිමත් භාවයට පත්කරමින්, අවම කාලයකින් නෞකා සේවාවන් සපයමින්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ස්වකීය භූමියේ වටිනාකම් මැනවින් උපයුක්ත කරගනිමින්, සහෝදර පර්යන්තයන්ගේ සුසංයෝගී දායකත්වය තුළින් ප්‍රධාන නැව් සේවා හා පෝෂිත නැව් සේවා කොළඹ වරාය වෙත ආකර්ෂණය කර ගැනීමට නිරන්තරයෙන් කටයුතු කරමින් සිටියි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මේ සා සුවිසල් ජයග්‍රහණයෙහිලා වත්මන් රජයේ වරාය හා නාවික ගරු අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමාගේ විශිෂ්ඨ නායකත්වයත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතාගේ නිසි කළමණාකාරීත්වයත් වරාය මෙහෙයුම් ක්‍රියාවලියට සම්බන්ධ සියලුම පාර්ශ්වයන්ගේ යහපත් නායකත්වය තුළින් පසුගිය වසරවලට සාපේක්ෂව කඩිනම් සංවර්ධනයක් කරා ළඟාවීමට හැකි ව තිබේ.

ශ්‍රී ලංකාව සමුද්‍රික කලාපයේ කේන්ද්‍රය බවට පත් කිරීමට රජය ගෙන යන වැඩපිළිවෙල සක්‍රීය කරමින් රට වටා පිහිටි සියලු වාණිජ වරායයන් සංවර්ධනය කිරීමට විධිවිධාන යොදමින් පිහිටීමේ උපාය මාර්ගික ශක්‍යතාව මැනවින් උපයුක්ත කර ගනිමින් ඒ තුළින් ශ්‍රී ලාංකේය ආර්ථිකය ශක්තිමත් වර්ධනයට ඉඩකඩ සලස්වමින් වරාය ක්ෂේත්‍රයේ සාධනීය සංවර්ධනයක් කරා පිය එසවීමටත් ඒ තුළින් වරාය ආයෝජන අවස්ථා හා සංචාරක ප්‍රවර්ධන අවස්ථා පුළුල් කිරීමටත් අපේක්ෂිත ය.






කොළඹ වරායේ සංවර්ධන කටයුතු නිරීක්ෂණය කරමින්...



ත්‍රිකුණාමලය වරායේ සංවර්ධනය ට මුල පුරමින්..







කොළඹ වරායේ සේවා සැපයුම් පහසුකම් පුළුල් කරමින්...

කොළඹ 10, බෝධිරාජ මාවත, අංක 06 ස්ථානයේ පිහිටි ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික්ස් (පුද්) සමාගම මගින් මුද්‍රණය කරවා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය මගින් ප්‍රසිද්ධ කරන ලදී.